# අ.පො.ස (සා.පෙළ) විභාගය - 2011

# ඇගයීම් වාර්තාව

# 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
N E T S


පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2011

# ඇගයීම් වාර්තාව

# 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2011

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල්
පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය
(TSEP-WB) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, මෙම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස, ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් තොරතුරු සැපයූ ප්‍රධාන/ අතිරේක ප්‍රධාන/ සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2012 ඔක්තෝබර් 20
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර මයා<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර මිය<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය හා සංස්කරණය** | : | කේ.එන්. සෝමපාල මයා<br>සහකාර විභාග කොමසාරිස් |
| **සැකසුම් කමිටුව** | : | ජගත් බණ්ඩාරනායක මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
| | | එම්.ඒ. ඉන්ද්‍රා පද්මිණි පෙරේරා මිය<br>ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | ඩබ්.එම්. සුදුබණ්ඩා මයා<br>වාණිජ ගුරු උපදේශක<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය<br>පස්සර |
| | | ආර්.පී.ඩී.ජී. රාජපක්ෂ මිය<br>ශ්‍රී ලංකා ගුරු සේවය<br>බප/ ජය/ හෙන්රි ඕල්කට් විද්‍යාලය<br>කොළොන්නාව |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ.ඒ.අයි. බණ්ඩාර මිය<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| | | ඩබ්.ඒ.ඩී. චතුරිකා දිසානායක මෙනවිය<br>දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු

පිටු අංකය


## I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10

## II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 11
2.1.2. I ප්‍රශ්න පත්‍රය 12
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 17
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව 18
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 19
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 20

2.2 II ප්‍රශ්න පත්‍රය

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 21
2.2.2. II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 22

## III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් සැලකිලිමත් විය යුතු කරුණු 45

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 46

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1. විෂය අභිමතාර්ථ

- ★ ව්‍යාපාර පරිසරයේ පවතින අවස්ථා හා අභියෝග පිළිබඳ අනුදැනුම සහිතව ව්‍යාපාර අවස්ථා තේරීම
- ★ මනා ව්‍යාපාර කළමනාකරණය සඳහා හැකියාව ලබා ගැනීම
- ★ ව්‍යාපාර ආයතනයක ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීමට, විශ්ලේෂණය කිරීමට යොමු වීමෙන් ව්‍යාපාරයේ තත්ත්වය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීම
- ★ ව්‍යාපාර ආශ්‍රිත වෘත්තියකට නැඹුරුවීම හෝ තමාගේම ව්‍යවසායක් ආරම්භ කිරීමේ හැකියාව ඇති කිරීම
- ★ ශ්‍රී ලංකාවේ ආර්ථික හා සාමාජයීය සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීම

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 72,708 | 1,407 | 74,115 |
| දෙමළ | 19,637 | 2,067 | 21,704 |
| ඉංග්‍රීසි | 1,382 | 1,949 | 3,331 |
| එකතුව | **93,727** | **5,423** | **99,150** |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 20,628 | 22.01 | 1,104 | 20.36 | 21,732 | 21.92 |
| B | 11,206 | 11.96 | 554 | 10.22 | 11,760 | 11.86 |
| C | 19,432 | 20.73 | 897 | 16.54 | 20,329 | 20.50 |
| S | 23,394 | 24.96 | 1,223 | 22.55 | 24,617 | 24.83 |
| W | 19,067 | 20.34 | 1,645 | 30.33 | 20,712 | 20.89 |
| එකතුව | **93,727** | **100** | **5,423** | **100** | **99,150** | **100** |

වගුව 2

### 1.2.3. පළමු වතාවට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 20351 | 6173 | 30.33 | 2705 | 13.29 | 4205 | 20.66 | 4125 | 20.27 | 17208 | 84.56 | 3143 | 15.44 |
| 2. ගම්පහ | 13357 | 3071 | 22.99 | 1753 | 13.12 | 2841 | 21.27 | 3168 | 23.72 | 10833 | 81.10 | 2524 | 18.90 |
| 3. කළුතර | 5826 | 1224 | 21.01 | 756 | 12.98 | 1278 | 21.94 | 1466 | 25.16 | 4724 | 81.08 | 1102 | 18.92 |
| 4. මහනුවර | 5478 | 1084 | 19.79 | 572 | 10.44 | 1073 | 19.59 | 1514 | 27.64 | 4243 | 77.46 | 1235 | 22.54 |
| 5. මාතලේ | 930 | 129 | 13.87 | 96 | 10.32 | 194 | 20.86 | 305 | 32.80 | 724 | 77.85 | 206 | 22.15 |
| 6. නුවරඑළිය | 1869 | 180 | 9.63 | 164 | 8.77 | 330 | 17.66 | 530 | 28.36 | 1204 | 64.42 | 665 | 35.58 |
| 7. ගාල්ල | 6249 | 1609 | 25.75 | 820 | 13.12 | 1325 | 21.20 | 1477 | 23.64 | 5231 | 83.71 | 1018 | 16.29 |
| 8. මාතර | 3313 | 928 | 28.01 | 463 | 13.98 | 741 | 22.37 | 786 | 23.72 | 2918 | 88.08 | 395 | 11.92 |
| 9. හම්බන්තොට | 1586 | 391 | 24.65 | 217 | 13.68 | 359 | 22.64 | 410 | 25.85 | 1377 | 86.82 | 209 | 13.18 |
| 10. යාපනය | 3250 | 578 | 17.78 | 408 | 12.55 | 828 | 25.48 | 907 | 27.91 | 2721 | 83.72 | 529 | 16.28 |
| 11. කිලිනොච්චි | 285 | 28 | 9.82 | 18 | 6.32 | 60 | 21.05 | 86 | 30.18 | 192 | 67.37 | 93 | 32.63 |
| 12. මන්නාරම | 327 | 38 | 11.62 | 27 | 8.26 | 71 | 21.71 | 117 | 35.78 | 253 | 77.37 | 74 | 22.63 |
| 13. වව්නියාව | 702 | 101 | 14.39 | 79 | 11.25 | 192 | 27.35 | 203 | 28.92 | 575 | 81.91 | 127 | 18.09 |
| 14. මුලතිව් | 199 | 16 | 8.04 | 25 | 12.56 | 44 | 22.11 | 71 | 35.68 | 156 | 78.39 | 43 | 21.61 |
| 15. මඩකලපුව | 1498 | 338 | 22.56 | 229 | 15.29 | 330 | 22.03 | 402 | 26.84 | 1299 | 86.72 | 199 | 13.28 |
| 16. අම්පාර | 1760 | 283 | 16.08 | 177 | 10.06 | 387 | 21.99 | 560 | 31.82 | 1407 | 79.94 | 353 | 20.06 |
| 17. ත්‍රිකුණාමලය | 1260 | 170 | 13.49 | 133 | 10.56 | 268 | 21.27 | 331 | 26.27 | 902 | 71.59 | 358 | 28.41 |
| 18. කුරුණෑගල | 3629 | 945 | 26.04 | 468 | 12.90 | 824 | 22.71 | 902 | 24.86 | 3139 | 86.50 | 490 | 13.50 |
| 19. පුත්තලම | 3249 | 645 | 19.85 | 367 | 11.30 | 633 | 19.48 | 893 | 27.49 | 2538 | 78.12 | 711 | 21.88 |
| 20. අනුරාධපුරය | 2178 | 403 | 18.50 | 259 | 11.89 | 504 | 23.14 | 590 | 27.09 | 1756 | 80.62 | 422 | 19.38 |
| 21. පොළොන්නරුව | 1124 | 190 | 16.90 | 113 | 10.05 | 257 | 22.86 | 326 | 29.00 | 886 | 78.83 | 238 | 21.17 |
| 22. බදුල්ල | 2720 | 367 | 13.49 | 224 | 8.24 | 540 | 19.85 | 718 | 26.40 | 1849 | 67.98 | 871 | 32.02 |
| 23. මොනරාගල | 686 | 88 | 12.83 | 76 | 11.08 | 134 | 19.53 | 208 | 30.32 | 506 | 73.76 | 180 | 26.24 |
| 24. රත්නපුරය | 3161 | 696 | 22.02 | 399 | 12.62 | 710 | 22.46 | 775 | 24.52 | 2580 | 81.62 | 581 | 18.38 |
| 25. කෑගල්ල | 2473 | 466 | 18.84 | 271 | 10.96 | 474 | 19.17 | 699 | 28.27 | 1910 | 77.23 | 563 | 22.77 |
| **සමස්ත දිවයින** | **87460** | **20141** | **23.03** | **10819** | **12.37** | **18602** | **21.27** | **21569** | **24.66** | **71131** | **81.33** | **16329** | **18.67** |

වගුව 3

### 1.2.4. පළමු වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 11059 | 3902 | 35.28 | 1357 | 12.27 | 2050 | 18.54 | 1985 | 17.95 | 9294 | 84.04 | 1765 | 15.96 |
| 2. හෝමාගම | 1456 | 252 | 17.31 | 170 | 11.68 | 352 | 24.18 | 388 | 26.65 | 1162 | 79.81 | 294 | 20.19 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 4123 | 1135 | 27.53 | 638 | 15.47 | 959 | 23.26 | 889 | 21.56 | 3621 | 87.82 | 502 | 12.18 |
| 4. පිළියන්දල | 3713 | 884 | 23.81 | 540 | 14.54 | 844 | 22.73 | 863 | 23.24 | 3131 | 84.33 | 582 | 15.67 |
| 5. ගම්පහ | 3831 | 1194 | 31.17 | 538 | 14.04 | 801 | 20.91 | 762 | 19.89 | 3295 | 86.01 | 536 | 13.99 |
| 6 මිනුවන්ගොඩ | 1680 | 304 | 18.10 | 221 | 13.15 | 369 | 21.96 | 456 | 27.14 | 1350 | 80.36 | 330 | 19.64 |
| 7. මීගමුව | 4111 | 765 | 18.61 | 480 | 11.68 | 902 | 21.94 | 1050 | 25.54 | 3197 | 77.77 | 914 | 22.23 |
| 8. කැලණිය | 3735 | 808 | 21.63 | 514 | 13.76 | 769 | 20.59 | 900 | 24.10 | 2991 | 80.08 | 744 | 19.92 |
| 9. කළුතර | 3740 | 786 | 21.02 | 493 | 13.18 | 859 | 22.97 | 916 | 24.49 | 3054 | 81.66 | 686 | 18.34 |
| 10. මතුගම | 615 | 129 | 20.98 | 84 | 13.66 | 120 | 19.51 | 144 | 23.41 | 477 | 77.56 | 138 | 22.44 |
| 11. හොරණ | 1471 | 309 | 21.01 | 179 | 12.17 | 299 | 20.33 | 406 | 27.60 | 1193 | 81.10 | 278 | 18.90 |
| 12. මහනුවර | 2486 | 786 | 31.62 | 338 | 13.60 | 555 | 22.33 | 538 | 21.64 | 2217 | 89.18 | 269 | 10.82 |
| 13. දෙනුවර | 588 | 74 | 12.59 | 51 | 8.67 | 105 | 17.86 | 205 | 34.86 | 435 | 73.98 | 153 | 26.02 |
| 14. ගම්පොල | 855 | 78 | 9.12 | 84 | 9.82 | 118 | 13.80 | 263 | 30.76 | 543 | 63.51 | 312 | 36.49 |
| 15. තෙල්දෙණිය | 156 | 22 | 14.10 | 8 | 5.13 | 32 | 20.51 | 46 | 29.49 | 108 | 69.23 | 48 | 30.77 |
| 16. වත්තේගම | 557 | 50 | 8.98 | 36 | 6.46 | 100 | 17.95 | 179 | 32.14 | 365 | 65.53 | 192 | 34.47 |
| 17. කටුගස්තොට | 836 | 74 | 8.85 | 55 | 6.58 | 163 | 19.50 | 283 | 33.85 | 575 | 68.78 | 261 | 31.22 |
| 18. මාතලේ | 670 | 93 | 13.88 | 69 | 10.30 | 140 | 20.90 | 221 | 32.99 | 523 | 78.06 | 147 | 21.94 |
| 19. ගලේවෙල | 185 | 33 | 17.84 | 23 | 12.43 | 43 | 23.24 | 55 | 29.73 | 154 | 83.24 | 31 | 16.76 |
| 20. නාඋල | 33 | 0 | 0.00 | 0 | 0.00 | 7 | 21.21 | 12 | 36.36 | 19 | 57.58 | 14 | 42.42 |
| 21. විල්ගමුව | 42 | 3 | 7.14 | 4 | 9.52 | 4 | 9.52 | 17 | 40.48 | 28 | 66.67 | 14 | 33.33 |
| 22. නුවරඑළිය | 525 | 34 | 6.48 | 31 | 5.90 | 74 | 14.10 | 150 | 28.57 | 289 | 55.05 | 236 | 44.95 |
| 23. කොත්මලේ | 235 | 19 | 8.09 | 18 | 7.66 | 52 | 22.13 | 96 | 40.85 | 185 | 78.72 | 50 | 21.28 |
| 24. හැටන් | 682 | 85 | 12.46 | 73 | 10.70 | 106 | 15.54 | 162 | 23.75 | 426 | 62.46 | 256 | 37.54 |
| 25. වලපනේ | 144 | 7 | 4.86 | 9 | 6.25 | 20 | 13.89 | 45 | 31.25 | 81 | 56.25 | 63 | 43.75 |
| 26. හඟුරන්කෙත | 283 | 35 | 12.37 | 33 | 11.66 | 78 | 27.56 | 77 | 27.21 | 223 | 78.80 | 60 | 21.20 |
| 27. ගාල්ල | 3206 | 953 | 29.73 | 428 | 13.35 | 689 | 21.49 | 699 | 21.80 | 2769 | 86.37 | 437 | 13.63 |
| 28. ඇල්පිටිය | 974 | 175 | 17.97 | 122 | 12.53 | 223 | 22.90 | 245 | 25.15 | 765 | 78.54 | 209 | 21.46 |
| 29. අම්බලන්ගොඩ | 1714 | 403 | 23.51 | 204 | 11.90 | 341 | 19.89 | 432 | 25.20 | 1380 | 80.51 | 334 | 19.49 |
| 30. උඩුගම | 355 | 78 | 21.97 | 66 | 18.59 | 72 | 20.28 | 101 | 28.45 | 317 | 89.30 | 38 | 10.70 |
| 31. මාතර | 2043 | 661 | 32.35 | 307 | 15.03 | 476 | 23.30 | 423 | 20.70 | 1867 | 91.39 | 176 | 8.61 |
| 32. අකුරැස්ස | 365 | 68 | 18.63 | 41 | 11.23 | 61 | 16.71 | 114 | 31.23 | 284 | 77.81 | 81 | 22.19 |
| 33. මුලටියන-හක්මණ | 414 | 114 | 27.54 | 64 | 15.46 | 98 | 23.67 | 99 | 23.91 | 375 | 90.58 | 39 | 9.42 |
| 34. මොරවක-දෙනියාය | 491 | 85 | 17.31 | 51 | 10.39 | 106 | 21.59 | 150 | 30.55 | 392 | 79.84 | 99 | 20.16 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 457 | 116 | 25.38 | 73 | 15.97 | 110 | 24.07 | 112 | 24.51 | 411 | 89.93 | 46 | 10.07 |
| 36. හම්බන්තොට | 655 | 82 | 12.52 | 69 | 10.53 | 153 | 23.36 | 213 | 32.52 | 517 | 78.93 | 138 | 21.07 |
| 37. වලස්මුල්ල | 474 | 193 | 40.72 | 75 | 15.82 | 96 | 20.25 | 85 | 17.93 | 449 | 94.73 | 25 | 5.27 |
| 38. යාපනය | 1606 | 334 | 20.80 | 222 | 13.82 | 436 | 27.15 | 398 | 24.78 | 1390 | 86.55 | 216 | 13.45 |
| 39. දූපත් | 104 | 8 | 7.69 | 7 | 6.73 | 18 | 17.31 | 37 | 35.58 | 70 | 67.31 | 34 | 32.69 |
| 40. තෙන්මාරච්චි | 214 | 54 | 25.23 | 30 | 14.02 | 57 | 26.64 | 49 | 22.90 | 190 | 88.79 | 24 | 11.21 |
| 41. වලිකාමන් | 708 | 92 | 12.99 | 67 | 9.46 | 184 | 25.99 | 227 | 32.06 | 570 | 80.51 | 138 | 19.49 |
| 42. වඩමරච්චි | 618 | 90 | 14.56 | 82 | 13.27 | 133 | 21.52 | 196 | 31.72 | 501 | 81.07 | 117 | 18.93 |
| 43. කිලිනොච්චි | 285 | 28 | 9.82 | 18 | 6.32 | 60 | 21.05 | 86 | 30.18 | 192 | 67.37 | 93 | 32.63 |
| 44. මන්නාරම | 322 | 38 | 11.80 | 27 | 8.39 | 70 | 21.74 | 114 | 35.40 | 249 | 77.33 | 73 | 22.67 |
| 45. මඩු | 5 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 20.00 | 3 | 60.00 | 4 | 80.00 | 1 | 20.00 |
| 46. වව්නියාව | 651 | 89 | 13.67 | 77 | 11.83 | 182 | 27.96 | 184 | 28.26 | 532 | 81.72 | 119 | 18.28 |
| 47. වව්නියාව උතුර | 51 | 12 | 23.53 | 2 | 3.92 | 10 | 19.61 | 19 | 37.25 | 43 | 84.31 | 8 | 15.69 |
| 48. මුලතිව් | 138 | 11 | 7.97 | 20 | 14.49 | 31 | 22.46 | 50 | 36.23 | 112 | 81.16 | 26 | 18.84 |
| 49. තුනුක්කායි | 61 | 5 | 8.20 | 5 | 8.20 | 13 | 21.31 | 21 | 34.43 | 44 | 72.13 | 17 | 27.87 |
| 50. මඩකලපුව | 629 | 148 | 23.53 | 100 | 15.90 | 125 | 19.87 | 162 | 25.76 | 535 | 85.06 | 94 | 14.94 |
| 51. කල්කුඩා | 168 | 19 | 11.31 | 22 | 13.10 | 37 | 22.02 | 60 | 35.71 | 138 | 82.14 | 30 | 17.86 |
| 52. පදිරිප්පු | 151 | 40 | 26.49 | 17 | 11.26 | 46 | 30.46 | 36 | 23.84 | 139 | 92.05 | 12 | 7.95 |
| 53. මඩකලපුව (මධ්‍යම) | 550 | 131 | 23.82 | 90 | 16.36 | 122 | 22.18 | 144 | 26.18 | 487 | 88.55 | 63 | 11.45 |
| 54. අම්පාර | 203 | 42 | 20.69 | 36 | 17.73 | 65 | 32.02 | 37 | 18.23 | 180 | 88.67 | 23 | 11.33 |
| 55. කල්මුනේ | 518 | 87 | 16.80 | 28 | 5.41 | 110 | 21.24 | 159 | 30.69 | 384 | 74.13 | 134 | 25.87 |
| 56. සමන්තුරෙයි | 189 | 22 | 11.64 | 17 | 8.99 | 34 | 17.99 | 62 | 32.80 | 135 | 71.43 | 54 | 28.57 |
| 57. මහඔය | 110 | 9 | 8.18 | 10 | 9.09 | 23 | 20.91 | 44 | 40.00 | 86 | 78.18 | 24 | 21.82 |
| 58. දෙහිඅත්තකණ්ඩිය | 169 | 42 | 24.85 | 28 | 16.57 | 39 | 23.08 | 38 | 22.49 | 147 | 86.98 | 22 | 13.02 |
| 59. අක්කරෙයිපත්තුව | 571 | 81 | 14.19 | 58 | 10.16 | 116 | 20.32 | 220 | 38.53 | 475 | 83.19 | 96 | 16.81 |
| 60. ත්‍රිකුණාමලය | 928 | 146 | 15.73 | 102 | 10.99 | 204 | 21.98 | 238 | 25.65 | 690 | 74.35 | 238 | 25.65 |
| 61. මුතූර් | 49 | 2 | 4.08 | 5 | 10.20 | 13 | 26.53 | 21 | 42.86 | 41 | 83.67 | 8 | 16.33 |
| 62. කන්තලේ | 183 | 13 | 7.10 | 22 | 12.02 | 43 | 23.50 | 46 | 25.14 | 124 | 67.76 | 59 | 32.24 |
| 63. කින්නියා | 100 | 9 | 9.00 | 4 | 4.00 | 8 | 8.00 | 26 | 26.00 | 47 | 47.00 | 53 | 53.00 |
| 64. කුරුණෑගල | 1333 | 456 | 34.21 | 165 | 12.38 | 270 | 20.26 | 294 | 22.06 | 1185 | 88.90 | 148 | 11.10 |
| 65. කුලියාපිටිය | 709 | 213 | 30.04 | 106 | 14.95 | 169 | 23.84 | 157 | 22.14 | 645 | 90.97 | 64 | 9.03 |
| 66. නිකවැරටිය | 198 | 27 | 13.64 | 18 | 9.09 | 46 | 23.23 | 56 | 28.28 | 147 | 74.24 | 51 | 25.76 |
| 67. මහව | 246 | 37 | 15.04 | 31 | 12.60 | 60 | 24.39 | 78 | 31.71 | 206 | 83.74 | 40 | 16.26 |
| 68. ගිරිඋල්ල | 693 | 131 | 18.90 | 85 | 12.27 | 158 | 22.80 | 200 | 28.86 | 574 | 82.83 | 119 | 17.17 |
| 69. ඉබ්බාගමුව | 450 | 81 | 18.00 | 63 | 14.00 | 121 | 26.89 | 117 | 26.00 | 382 | 84.89 | 68 | 15.11 |
| 70. පුත්තලම | 1064 | 123 | 11.56 | 95 | 8.93 | 188 | 17.67 | 346 | 32.52 | 752 | 70.68 | 312 | 29.32 |
| 71. හලාවත | 2185 | 522 | 23.89 | 272 | 12.45 | 445 | 20.37 | 547 | 25.03 | 1786 | 81.74 | 399 | 18.26 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 72. අනුරාධපුරය | 1190 | 284 | 23.87 | 157 | 13.19 | 279 | 23.45 | 273 | 22.94 | 993 | 83.45 | 197 | 16.55 |
| 73. තඹුත්තේගම | 328 | 36 | 10.98 | 33 | 10.06 | 76 | 23.17 | 109 | 33.23 | 254 | 77.44 | 74 | 22.56 |
| 74. කැකිරාව | 235 | 43 | 18.30 | 26 | 11.06 | 58 | 24.68 | 52 | 22.13 | 179 | 76.17 | 56 | 23.83 |
| 75. ගලෙන්බිඳුනුවැව | 219 | 16 | 7.31 | 22 | 10.05 | 49 | 22.37 | 83 | 37.90 | 170 | 77.63 | 49 | 22.37 |
| 76. කැබිතිගොල්ලෑව | 206 | 24 | 11.65 | 21 | 10.19 | 42 | 20.39 | 73 | 35.44 | 160 | 77.67 | 46 | 22.33 |
| 77. පොළොන්නරුව | 484 | 132 | 27.27 | 53 | 10.95 | 115 | 23.76 | 126 | 26.03 | 426 | 88.02 | 58 | 11.98 |
| 78. හිඟුරක්ගොඩ | 378 | 44 | 11.64 | 44 | 11.64 | 85 | 22.49 | 96 | 25.40 | 269 | 71.16 | 109 | 28.84 |
| 79. දිඹුලාගල | 262 | 14 | 5.34 | 16 | 6.11 | 57 | 21.76 | 104 | 39.69 | 191 | 72.90 | 71 | 27.10 |
| 80. බදුල්ල | 791 | 104 | 13.15 | 53 | 6.70 | 168 | 21.24 | 227 | 28.70 | 552 | 69.79 | 239 | 30.21 |
| 81. බණ්ඩාරවෙල | 1079 | 203 | 18.81 | 113 | 10.47 | 211 | 19.56 | 248 | 22.98 | 775 | 71.83 | 304 | 28.17 |
| 82. මහියංගනය | 203 | 9 | 4.43 | 14 | 6.90 | 54 | 26.60 | 58 | 28.57 | 135 | 66.50 | 68 | 33.50 |
| 83. වැලිමඩ | 508 | 42 | 8.27 | 36 | 7.09 | 92 | 18.11 | 134 | 26.38 | 304 | 59.84 | 204 | 40.16 |
| 84. පස්සර | 139 | 9 | 6.47 | 8 | 5.76 | 15 | 10.79 | 51 | 36.69 | 83 | 59.71 | 56 | 40.29 |
| 85. මොණරාගල | 235 | 30 | 12.77 | 28 | 11.91 | 42 | 17.87 | 67 | 28.51 | 167 | 71.06 | 68 | 28.94 |
| 86. වැල්ලවාය | 263 | 33 | 12.55 | 28 | 10.65 | 61 | 23.19 | 74 | 28.14 | 196 | 74.52 | 67 | 25.48 |
| 87. බිබිල | 188 | 25 | 13.30 | 20 | 10.64 | 31 | 16.49 | 67 | 35.64 | 143 | 76.06 | 45 | 23.94 |
| 88. රත්නපුර | 1666 | 493 | 29.59 | 232 | 13.93 | 379 | 22.75 | 335 | 20.11 | 1439 | 86.37 | 227 | 13.63 |
| 89. බලන්ගොඩ | 539 | 92 | 17.07 | 68 | 12.62 | 130 | 24.12 | 148 | 27.46 | 438 | 81.26 | 101 | 18.74 |
| 90. නිවිතිගල | 284 | 25 | 8.80 | 16 | 5.63 | 48 | 16.90 | 99 | 34.86 | 188 | 66.20 | 96 | 33.80 |
| 91. ඇඹිලිපිටිය | 672 | 86 | 12.80 | 83 | 12.35 | 153 | 22.77 | 193 | 28.72 | 515 | 76.64 | 157 | 23.36 |
| 92. කෑගල්ල | 1149 | 312 | 27.15 | 139 | 12.10 | 230 | 20.02 | 276 | 24.02 | 957 | 83.29 | 192 | 16.71 |
| 93. මාවනැල්ල | 767 | 90 | 11.73 | 65 | 8.47 | 126 | 16.43 | 262 | 34.16 | 543 | 70.80 | 224 | 29.20 |
| 94. දෙහිඕවිට | 557 | 64 | 11.49 | 67 | 12.03 | 118 | 21.18 | 161 | 28.90 | 410 | 73.61 | 147 | 26.39 |
| **සමස්ත දිවයින** | **87460** | **20141** | **23.03** | **10819** | **12.37** | **18602** | **21.27** | **21569** | **24.66** | **71131** | **81.33** | **16329** | **18.67** |

වගුව 4

1.2.5. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 3,096 | 3.12 | 99,150 | 100 |
| 81 - 90 | 9,000 | 9.08 | 96,054 | 96.88 |
| 71 - 80 | 11,318 | 11.41 | 87,054 | 87.80 |
| 61 - 70 | 12,563 | 12.67 | 75,736 | 76.39 |
| 51 - 60 | 14,143 | 14.26 | 63,173 | 63.72 |
| 41 - 50 | 15,079 | 15.21 | 49,030 | 49.46 |
| 31 - 40 | 16,060 | 16.20 | 33,951 | 34.25 |
| 21 - 30 | 12,720 | 12.83 | 17,891 | 18.05 |
| 11 - 20 | 4,885 | 4.93 | 5,171 | 5.22 |
| 01 - 10 | 286 | 0.29 | 286 | 0.29 |
| 00 - 00 | 0 | 0 | 0 | 0 |

වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- (31 - 40 පන්ති ප්‍රාන්තරය ගතහොත්)
මෙම විෂයය සඳහා 31 - 40 තෙක් ලකුණු ලබාගත් සංඛ්‍යාව 16,060කි. එය ප්‍රතිශතයක් වශයෙන් 16.20%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 33,951ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 34.25%කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 1.1** (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 1 ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 95%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 32 ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 25%කි.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙම ප්‍රශ්න පත්‍රයේ 1 ප්‍රශ්නය අනිවාර්ය වුවද සුළු පිරිසක් එම ප්‍රශ්නයට ද පිළිතුරු සපයා නොතිබුණි. ප්‍රශ්න තෝරා ගැනීමේ දී 88%ක්, 3 වන ප්‍රශ්නය තෝරාගෙන තිබූ අතර 4 වන ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 47% ක් පමණි.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. මෙම ලකුණු වලින්, 76%-100% පන්ති ප්‍රාන්තරයේ එනම් ලකුණු 16-20 අතර ලබා ගත් ප්‍රතිශතය 15%කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0-25% පන්ති ප්‍රාන්තරයේ එනම් ලකුණු 00-05 තෙක් ලබා ගත් ප්‍රතිශතය 23%කි.

ප්‍රස්තාරය 3 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4.1 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 1 ප්‍රශ්නයෙහි ii (අ) අනුකොටසෙහි පහසුතාව 92% ක් වන අතර, මෙම ප්‍රශ්නයේ (ix) කොටසෙහි පහසුතාව 29% කි.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රය

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

**කාලය පැය 01යි.** (ප්‍රශ්න පත්‍රයට නියමිත පැය තුනක (03) කාලයෙන් පැය එකක් (01) I ප්‍රශ්න පත්‍රය සඳහා යොදා ගැනීම අපේක්ෂා කෙරිණි.)

- ⋆ I ප්‍රශ්න පත්‍රය වරණ හතරකින් යුත් බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ.
- ⋆ 1 - 20 තෙක් ප්‍රශ්න ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයෙන් ද, 21 - 40 තෙක් ප්‍රශ්න ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයෙන් ද සකස් කර ඇත.
- ⋆ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.
- ⋆ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3) හා (4) හි පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තේරීම අපේක්ෂා කෙරිණි.
- ⋆ I ප්‍රශ්න පත්‍රය සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු **40**ක් හිමිවේ.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

- පහත සඳහන් ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කරමින් අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම උදෙසා භාණ්ඩ හා සේවා සැපයීමට අදාළ නිෂ්පාදනය, බෙදාහැරීම හා විකිණීම යනාදී ඕනෑම කාර්යයක් ව්‍යාපාර ලෙස හැඳින්වේ. ආරම්භයේදී සරලව පැවති ව්‍යාපාර කටයුතු අද වන විට සංකීර්ණත්වයට පත්ව ඇත. එසේම ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා සංවිධාන ක්‍රම රාශියක් ද ස්ථාපිතව ඇත."

1. ව්‍යාපාර ආරම්භවීමට බලපෑ මූලික සාධකය වූයේ

(1) අවශ්‍යතා හා වුවමනා ය.
(2) භාණ්ඩ හා සේවා ය.
(3) ඉල්ලුම හා සැපයුම ය.
(4) නිෂ්පාදනය හා බෙදාහැරීම ය.

2. පහත සඳහන් ද අතුරෙන් මිනිස් අවශ්‍යතාවක් ලෙස සැලකිය හැක්කේ කුමක් ද?

(1) පොත් පත්
(2) ආහාර පාන
(3) බත් හා ව්‍යංජන
(4) සුවඳ විලවුන්

3. ව්‍යාපාර විකාශනයේ අදියර අනුපිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) මුදල් භාවිතය, භාණ්ඩ හුවමාරුව, කාර්මික විප්ලවය, තොරතුරු තාක්ෂණය
(2) තොරතුරු තාක්ෂණය, කාර්මික විප්ලවය, මුදල් භාවිතය, භාණ්ඩ හුවමාරුව
(3) භාණ්ඩ හුවමාරුව, කාර්මික විප්ලවය, මුදල් භාවිතය, තොරතුරු තාක්ෂණය
(4) භාණ්ඩ හුවමාරුව, මුදල් භාවිතය, කාර්මික විප්ලවය, තොරතුරු තාක්ෂණය

4. පතල් හා කැනීම් නිෂ්පාදන අයත් වන්නේ

(1) ප්‍රාථමික නිෂ්පාදනයට ය.
(2) ද්විතීයික නිෂ්පාදනයට ය.
(3) තෘතීයික නිෂ්පාදනයට ය.
(4) කෘෂිකාර්මික නිෂ්පාදනයට ය.

5. කේවලස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවල **දැකිය නොහැකි** එහෙත් සීමිත සමාගම්වල **දැකිය හැකි** ලක්ෂණයක් වන්නේ

(1) අරමුණක් තිබීම ය.
(2) ආර්ථික කටයුත්තක නියැලීම ය.
(3) නෛතික පුද්ගලභාවයක් පැවතීම ය.
(4) පැවැත්මක් තිබීම ය.

6. රියදුරු පුහුණු පාසලක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය බලපත්‍රය ලබා ගත යුත්තේ

(1) අධ්‍යාපන අමාත්‍යාංශයෙනි.
(2) මධ්‍යම පරිසර අධිකාරියෙනි.
(3) විදේශ සේවා නියුක්ති කාර්යංශයෙනි.
(4) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවෙනි.

7. ව්‍යාපාරිකයෙකු විසින් ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට පෙර කළයුතු වන්නේ

(1) ව්‍යාපාර අවස්ථාවක් හඳුනා ගැනීම ය.
(2) ආදායම් ප්‍රකාශයක් සකස් කිරීම ය.
(3) ශේෂ පත්‍රයක් සකස් කිරීම ය.
(4) මානව සම්පත් ඇස්තමේන්තු කිරීම ය.

8. මුළු නිෂ්පාදන පිරිවැය නිවැරදිව දක්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) සෘජු ද්‍රව්‍ය පිරිවැය + සෘජු ශ්‍රම පිරිවැය
(2) වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + ප්‍රාථමික පිරිවැය
(3) ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය
(4) සෘජු ද්‍රව්‍ය පිරිවැය + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය

9. යම් නිශ්චිත අනාගත කාලයක් තුළදී ව්‍යාපාරයක අපේක්ෂිත මුදල් ගලා ඒම් සහ ගලා යාම් පෙන්නුම් කිරීම සඳහා සකස් කරනු ලබන්නේ

(1) ශේෂ පත්‍රයයි.
(2) ආදායම් ප්‍රකාශයයි.
(3) මුදල් පොතයි.
(4) මුදල් ප්‍රවාහ ප්‍රකාශයයි.

10. ව්‍යාපාර සැලැස්මකට අදාළව පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යාපාර සැලැස්මක් අවශ්‍යවන්නේ අලුතින් ආරම්භ කරන ව්‍යාපාරවලට පමණි.
(2) ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීමට ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(3) ව්‍යාපාර සැලැස්මක දක්වෙන්නේ ඇස්තමේන්තුගත තොරතුරු ය.
(4) ව්‍යාපාර සැලසුම් පිළියෙල කිරීමේ එකම අරමුණ වන්නේ ණය මුදලක් ලබා ගැනීම ය.

11. "ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ තුළ පවත්නා මිල උද්ධමන අනුපාතිකය ක්‍රමයෙන් අඩුවෙමින් පවතිනු දකිය හැකි ය." මෙහි සඳහන් මිල උද්ධමනය අයත්වන පරිසර සාධකය කුමක් ද?

(1) සංස්කෘතික (2) දේශපාලනික (3) ආර්ථික (4) තාක්ෂණික

12. ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේදී ඉලක්ක පාරිභෝගික සංඛ්‍යාව ඇතුළත් වන්නේ

(1) මූල්‍ය සැලැස්මෙහි ය. (2) අලෙවි සැලැස්මෙහි ය.
(3) මෙහෙයුම් සැලැස්මෙහි ය. (4) මානව සම්පත් සැලැස්මෙහි ය.

13. ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ තුළ බැංකු හා වෙනත් මූල්‍ය ආයතන රාශියක් දකිය හැකි ය. මේවා නියාමනය කරනු ලබන්නේ

(1) මුදල් අමාත්‍යාංශය විසිනි. (2) මහා භාණ්ඩාගාරය විසිනි.
(3) ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි. (4) ලංකා බැංකුව විසිනි.

14. පහත දක්වෙන්නේ චෙක්පත් රේඛනය කිරීමේ ක්‍රම කිහිපයකි.




A B C D

මේවා අතුරෙන් විශේෂ රේඛනයක් වන්නේ

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

15. ණයකාඩ්පතක් ලෙස සැලකෙන්නේ

(1) මහජන බැංකුවේ PET කාඩ්පත ය. (2) සම්පත් බැංකුවේ SET කාඩ්පත ය.
(3) කොමර්ෂල් බැංකුවේ CAT කාඩ්පත ය. (4) ලංකා බැංකුවේ සී බෑන්ක් වීසා කාඩ්පත ය.

16. හානිපූරණ මූලධර්මය **බලනොපාන** රක්ෂණ වර්ගය වන්නේ

(1) ජීවිත රක්ෂණයයි. (2) ගිනි රක්ෂණයයි.
(3) මුහුදු උවදුරු රක්ෂණයයි. (4) රථවාහන රක්ෂණයයි.

17. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග **පමණක්** ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නිවැරදි බව, පැහැදිලි බව, ලබන්නා, ප්‍රතිචාරය
(2) යවන්නා, ප්‍රතිචාරය, මාධ්‍යය, ලබන්නා
(3) වේගය, පිරිවැය, යවන්නා, ලබන්නා
(4) යවන්නා, ලබන්නා, ප්‍රතිචාරය, පැහැදිලි බව

18. ගීතා එක්තරා සමාගමක සාමාන්‍ය කොටස් 100 ක් එකක් රු. 24 බැගින් මිලදී ගත් අතර වර්ෂයක් අවසානයේදී ඇයට කොටසකට රු. 5 බැගින් ලාභාංශ හිමි විය. එම ලාභාංශ ලැබීමෙන් පසු ඇය එක් කොටසක් රු. 26.50 බැගින් කොටස් සියල්ල විකුණන ලදී. එම කොටස් ගනුදෙනුව නිසා ගීතා එම වර්ෂයේ දී ලද මුළු ප්‍රතිලාභය

(1) රු. 250 කි. (2) රු. 500 කි. (3) රු. 750 කි. (4) රු. 1000 කි.

19. විවිධ ආයෝජන මාර්ග පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කොටස්වල ආයෝජනය අවදානම ඉහළ, ප්‍රතිලාභ ඉහළ ආයෝජනයකි.
(2) ඉඩම් වැනි දේපල මිලදී ගැනීම ප්‍රතිලාභ ඉහළ, ද්‍රවශීලතාව ඉහළ ආයෝජන මාර්ගයකි.
(3) ඉතුරුම් තැන්පතුවල ආයෝජනය අවදානම පහළ, ප්‍රතිලාභ ඉහළ ආයෝජන මාර්ගයකි.
(4) භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය අවදානම ඉහළ, ප්‍රතිලාභ ඉහළ ආයෝජන මාර්ගයකි.

20. පහත X තීරුවේ ප්‍රවාහනයේ මූලිකාංග හා Y තීරුවේ ඊට අදාළ නිදසුන් ද දක්වේ.

| X | Y |
|---|---|
| 1. මාර්ගය | A - ගෑස් |
| 2. මාධ්‍යය | B - ගුවන |
| 3. බලය | C - දුම්රිය |
| 4. පර්යන්තය | D - වරාය |

X තීරුවේ සඳහන් මූලිකාංග Y තීරුවේ සඳහන් නිදසුන් සමඟ නිවැරදිව අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) A, B, C, D (2) B, A, C, D (3) B, C, A, D (4) B, C, D, A

21. පහත X තීරුවේ ව්‍යාපාර ආයතනයක දැකිය හැකි විවිධ ගිණුම් කිහිපයක් සහ Y තීරුවේ ප්‍රධාන ගිණුම් වර්ග කිහිපයක් දක්වේ.

| X | Y |
|---|---|
| 1. බැංකු ණය ගිණුම | A - වත්කම් ගිණුම් |
| 2. ගොඩනැගිලි ගිණුම | B - ආදායම් ගිණුම් |
| 3. රක්ෂණ ගාස්තු ගිණුම | C - වගකීම් ගිණුම් |
| 4. ලැබූ ගෙවල් කුලී ගිණුම | D - වියදම් ගිණුම් |

X තීරුවේ සඳහන් ගිණුම්, Y තීරුවේ සඳහන් ගිණුම් වර්ග සමඟ අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) C, A, B, D (2) C, A, D, B (3) D, B, A, C (4) D, B, C, A

22. 2011.03.31 දිනට කවිඳුගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය පහත ආකාරයට නිරූපණය විය.

වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්

රු. 92 500 = රු. 67 500 + රු. 25 000

රු. 4 250 ක ආයෝජන ආදායමක් ලැබීමෙන් පසු මෙම ව්‍යාපාරයේ නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.

| | වත්කම් (රු.) | = ප්‍රාග්ධනය (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| (1) | 96 750 | = 67 500 | + | 29 250 |
| (2) | 88 250 | = 63 250 | + | 25 000 |
| (3) | 92 500 | = 71 750 | + | 20 750 |
| (4) | 96 750 | = 71 750 | + | 25 000 |

● පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් අංක **23** සිට **26** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2011 මාර්තු මාසය තුළ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දක්වේ.

A - සුනිල්ට ණයට විකුණූ භාණ්ඩවලින් රු. 1 500 ක භාණ්ඩ ආපසු එවීම

B - ව්‍යාපාරයට රු. 500 000 ක් වටිනා මෝටර් රථයක් සුපර් මෝටර්ස් වෙතින් ණයට ලබා ගැනීම

C - ණයගැතියෙකු වූ අරුණගෙන් රු. 200 ක වට්ටමක් අඩු කර රු. 2 800 ක් ලබා ගැනීම

D - සාරා වෙළඳුන්ගෙන් ණයට ගනු ලැබූ භාණ්ඩවලින් රු. 2 000 ක් වටිනා භාණ්ඩ ආපසු යැවීම

23. ලෙජර් ගිණුමක් ලෙසද සැලකෙන මූලික සටහන් පොතෙහි සටහන් වන ගනුදෙනුව කුමක් ද?

(1) A (2) B (3) C (4) D

24. B ගනුදෙනුව සටහන් කෙරෙන මූලික පොත වන්නේ

(1) මුදල් පොතයි. (2) විකුණුම් ජ'නලයයි.
(3) ගැනුම් ජ'නලයයි. (4) පොදු ජ'නලයයි.

25. C ගනුදෙනුව සටහන් කිරීම දක්වන නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

(1) මුදල් ගිණුම හර රු. 3 000
අරුණගේ ගිණුම බැර රු. 3 000

(2) මුදල් ගිණුම හර රු. 2 800
අරුණගේ ගිණුම බැර රු. 2 800

(3) මුදල් ගිණුම හර රු. 2 800
දුන් වට්ටම් ගිණුම හර රු. 200
අරුණගේ ගිණුම බැර රු. 3 000

(4) අරුණගේ ගිණුම හර රු. 3 000
මුදල් ගිණුම බැර රු. 2 800
ලද වට්ටම් ගිණුම බැර රු. 200

26. බැරපත මූලාශ්‍ර ලේඛනයක් ලෙස භාවිත කෙරෙන ගනුදෙනුව වන්නේ

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

27. චෙක්පත් නිකුත් කිරීම, මුදල් පොතේ බැංකු තීරුවේ සටහන් කිරීමේදී අදාළ කරගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ

(1) මුදල් තැන්පත් පත්‍රය ය. (2) චෙක්පතේ පිළිපත ය.
(3) බැංකු ප්‍රකාශය ය. (4) චෙක්පත් තැන්පත් පත්‍රය ය.

28. 2011 මාර්තු මාසයේ සඳුන්ගේ ව්‍යාපාරයේ බැංකු ප්‍රකාශයේ බැර ශේෂය රු. 9 000 ක් ලෙසත් මුදල් පොතේ බැංකු තීරුවේ හර ශේෂය රු. 10 500 ක් ලෙසත් සටහන්ව තිබුණි. මෙම වෙනසට හේතුව විය හැක්කේ

(1) ව්‍යාපාරය වෙනුවෙන් බැංකුවට සෘජුවම ලැබුණු ලාභාංශ ය.
(2) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් ය.
(3) බැංකුවට ලැබී තිබුණු ණයගැති ප්‍රේෂණ ය.
(4) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ය.

● පහත සඳහන් වගන්තිය ඇසුරින් අංක **29** හා **30** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"සුමිත්ගේ ව්‍යාපාරයේ කාර්යාලය සඳහා ලිබඩු මිලදී ගැනීමට ගෙවූ රු. 12 000 ගැනුම් ගිණුමට හර කර ඇත."

29. ඉහත ප්‍රකාශයේ දැක්වෙන ගිණුම්කරණ දෝෂය

(1) ද්විකරණ දෝෂයකි. (2) මූලධර්ම දෝෂයකි. (3) අත්හැරීම් දෝෂයකි. (4) හිලව් දෝෂයකි.

30. මෙම දෝෂය නිවැරදි කිරීමට අදාළ නිවැරදි ජ'නල් සටහන තෝරන්න.

| | | රු. | රු. |
|---|---|---|---|
| (1) | ලිබඩු ගිණුම හර | 12 000 | |
| | ගැනුම් ගිණුම | | 12 000 |
| (2) | ලිබඩු ගිණුම හර | 12 000 | |
| | මුදල් ගිණුම | | 12 000 |
| (3) | ලිබඩු ගිණුම හර | 12 000 | |
| | අවිනිශ්චිත ගිණුම | | 12 000 |
| (4) | අවිනිශ්චිත ගිණුම හර | 12 000 | |
| | ගැනුම් ගිණුම | | 12 000 |

● පහත සඳහන් තොරතුරු ඇසුරින් අංක **31** හා **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තාරකා ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 100 ක් වන අතර වාර්ෂික සාමාජික මුදල රු. 200 කි. 2010.12.31 දිනට සාමාජිකයින් 10 දෙනෙකු පසුගිය වසරට හා මෙම වසරට අදාළ සාමාජික මුදල් ගෙවා නොමැත. අනිකුත් සියලුම සාමාජිකයින් ඒ ඒ වර්ෂයට අදාළ සාමාජික මුදල් ගෙවා ඇති අතර මෙම වර්ෂය තුළ ලැබූ මුළු සාමාජික මුදල රු. 18 000 කි. කිසිදු සාමාජිකයකු ඉදිරි වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නැත.

31. 2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ආදායම් හා වියදම් ගිණුමෙහි දැක්විය යුතු සාමාජික මුදල

(1) රු. 22 000 කි. (2) රු. 20 000 කි. (3) රු. 18 000 කි. (4) රු. 16 000 කි.

32. 2010.12.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල

(1) රු. 4 000 කි. (2) රු. 3 600 කි. (3) රු. 2 000 කි. (4) රු. 1 800 කි.

● පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් අංක **33** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පහන්ගේ ව්‍යාපාරයේ 2010.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙන් උපුටා ගත් ශේෂ පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| තොගය 2010.01.01 දිනට | 6 000 |
| ගැනුම් | 82 300 |
| විකුණුම් | 155 700 |
| ගෙනඒමේ කුලී | 7 600 |
| ආපසු යැවුම් | 6 400 |
| ආපසු එවුම් | 5 700 |
| ණයගැතියෝ | 20 000 |
| ණයහිමියෝ | 15 000 |
| 12% බැංකු ණය | 50 000 |
| ලිබඩු (පිරිවැයට) | 60 000 |
| බෙදාහැරීමේ වෑන් රථය (පිරිවැයට) | 100 000 |
| වේතන | 12 000 |
| ගෙවූ බැංකු ණය පොලී | 3 000 |
| ගෙවූ ගෙවල් කුලී | 9 000 |
| අතැති මුදල් | 15 400 |

පහත තොරතුරු ද සපයා ඇත.

- 2010.12.31 දිනට බදු තොගය රු. 9 500 කි.
- මාසික ගෙවල් කුලිය රු. 1 000 කි.
- ලිබඩු සහ බෙදාහැරීමේ වැන් රථය 10% බැගින් සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කළ යුතු ය.

33. මෙම ව්‍යාපාරයේ 2010.12.31 දිනෙන් අවසන් වර්ෂයේ විකුණූ බඩුවල පිරිවැය
(1) රු. 150 000 කි. (2) රු. 89 900 කි. (3) රු. 89 500 කි. (4) රු. 80 000 කි.

34. 2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ දළ ලාභය
(1) රු. 73 400 කි. (2) රු. 70 000 කි. (3) රු. 66 200 කි. (4) රු. 60 500 කි.

35. මෙම ව්‍යාපාරයේ 2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ දක්වෙන ගෙවල් කුලී
(1) රු. 21 000 කි. (2) රු. 12 000 කි. (3) රු. 10 000 කි. (4) රු. 9 000 කි.

36. මෙහි සඳහන් බැංකු ණය පොලී පිළිබඳ **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) ලාභාලාභ ගිණුමේ දක්විය යුතු බැංකු ණය පොලිය රු. 6 000 කි.
(2) ගෙවිය යුතු බැංකු ණය පොලිය රු. 3 000 කි.
(3) මුළු වාර්ෂික බැංකු ණය පොලිය වූ රු. 6 000 ම ගෙවා ඇත.
(4) වාර්ෂික බැංකු ණය පොලියෙන් 50% ක් ගෙවා ඇත.

37. මෙම ව්‍යාපාරයේ 2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමේ දක්වෙන ආයතන හා පරිපාලන වියදම්වල එකතුව
(1) රු. 30 000 කි. (2) රු. 27 000 කි. (3) රු. 24 000 කි. (4) රු. 21 000 කි.

38. දෙන ලද තොරතුරුවලට අනුව 2010.12.31 දිනට මෙම ව්‍යාපාරයේ මුළු ජංගම වත්කම්වල අගය
(1) රු. 204 900 කි. (2) රු. 195 400 කි. (3) රු. 44 900 කි. (4) රු. 35 400 කි.

39. 2010.12.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල ශුද්ධ අගය
(1) රු. 160 000 කි. (2) රු. 154 000 කි. (3) රු. 150 000 කි. (4) රු. 144 000 කි.

40. 2010.12.31 දිනට මෙම ව්‍යාපාරයේ මුළු වගකීම්
(1) රු. 71 000 කි. (2) රු. 68 000 කි. (3) රු. 65 000 කි. (4) රු. 21 000 කි.

2.1.3. **I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 1 | 21 | 2 |
| 02 | 2 | 22 | 4 |
| 03 | 4 | 23 | 3 |
| 04 | 1 | 24 | 4 |
| 05 | 3 | 25 | 3 |
| 06 | 4 | 26 | 1 |
| 07 | 1 | 27 | 2 |
| 08 | 3 | 28 | 4 |
| 09 | 4 | 29 | 2 |
| 10 | 3 | 30 | 1 |
| 11 | 3 | 31 | 2 |
| 12 | 2 | 32 | 1 |
| 13 | 3 | 33 | 4 |
| 14 | 4 | 34 | 2 |
| 15 | 4 | 35 | 2 |
| 16 | 1 | 36 | 3 |
| 17 | 2 | 37 | 1 |
| 18 | 3 | 38 | 3 |
| 19 | 1 | 39 | 4 |
| 20 | 3 | 40 | 1 |

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**

### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ - විෂය ක්ෂේත්‍ර අනුව







ප්‍රස්තාරයට අනුව ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලට වඩා ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයා ඇත. එය 19%ක වැඩිවීමකි.

2.1.5 **I** ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 |
| 1 | 1 | 95% | 2% | 1% | 2% |
| 2 | 2 | 2% | 94% | 3% | 1% |
| 3 | 4 | 2% | 1% | 30% | 67% |
| 4 | 1 | 54% | 26% | 13% | 7% |
| 5 | 3 | 5% | 7% | 74% | 14% |
| 6 | 4 | 3% | 3% | 1% | 93% |
| 7 | 1 | 87% | 3% | 2% | 8% |
| 8 | 3 | 7% | 5% | 71% | 17% |
| 9 | 4 | 12% | 15% | 33% | 40% |
| 10 | 3 | 13% | 17% | 65% | 5% |
| 11 | 3 | 1% | 6% | 91% | 2% |
| 12 | 2 | 6% | 62% | 13% | 19% |
| 13 | 3 | 14% | 5% | 78% | 3% |
| 14 | 4 | 4% | 9% | 13% | 74% |
| 15 | 4 | 17% | 8% | 11% | 64% |
| 16 | 1 | 76% | 5% | 14% | 5% |
| 17 | 2 | 3% | 88% | 3% | 6% |
| 18 | 3 | 21% | 13% | 59% | 7% |
| 19 | 1 | 30% | 24% | 32% | 14% |
| 20 | 3 | 2% | 6% | 89% | 3% |
| 21 | 2 | 8% | 86% | 3% | 3% |
| 22 | 4 | 11% | 5% | 7% | 77% |
| 23 | 3 | 9% | 21% | 63% | 7% |
| 24 | 4 | 14% | 4% | 42% | 40% |
| 25 | 3 | 3% | 16% | 66% | 15% |
| 26 | 1 | 59% | 8% | 5% | 28% |
| 27 | 2 | 4% | 61% | 24% | 11% |
| 28 | 4 | 10% | 26% | 12% | 52% |
| 29 | 2 | 9% | 70% | 7% | 14% |
| 30 | 1 | 55% | 12% | 17% | 16% |
| 31 | 2 | 7% | 56% | 32% | 5% |
| 32 | 1 | 25% | 5% | 66% | 4% |
| 33 | 4 | 27% | 12% | 22% | 39% |
| 34 | 2 | 13% | 54% | 17% | 16% |
| 35 | 2 | 6% | 49% | 23% | 22% |
| 36 | 3 | 13% | 17% | 52% | 18% |
| 37 | 1 | 29% | 27% | 20% | 24% |
| 38 | 3 | 8% | 17% | 50% | 25% |
| 39 | 4 | 18% | 15% | 12% | 55% |
| 40 | 1 | 35% | 25% | 25% | 15% |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

## 2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

මෙම ප්‍රශ්න පත්‍රයෙහි 1-20 තෙක් ප්‍රශ්න ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයෙන් ද, 21-40 තෙක් ප්‍රශ්න ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයෙන් ද සමන්විත විය. සමස්තයක් ලෙස ගත් විට ගිණුම්කරණය ප්‍රශ්නවලට වඩා ව්‍යාපාර අධ්‍යයනය ප්‍රශ්නවලට වැඩි පිරිසක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. එය 19%ක වැඩිවීමකි. විෂය නිර්දේශයේ ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයට අදාළ නිපුණතා එහි අග භාගයට (11 ශ්‍රේණිය සඳහා) යොදා තිබීම නිසා මෙහි සමහර කොටස් ආවරණය නොවීම මෙයට හේතුවක් විය හැකිය.

ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලින් 9 හා 19 ප්‍රශ්න හැර අනෙකුත් සියලුම ප්‍රශ්නවලට 50%ට වඩා වැඩි සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. 9 ප්‍රශ්නය 'ව්‍යාපාර සැලසුම' ඇසුරින් සකසා තිබූ අතර එහිදී බොහෝ අපේක්ෂකයින් 'අපේක්ෂිත මුදල්' යන්නෙහි 'අපේක්ෂිත' යන වචනය කෙරෙහි අවධානය යොමු නොකිරීම නිවැරදි පිළිතුර සැපයීමට අපොහොසත් වීමට හේතුවක් විය. එබැවින් වැඩි පිරිසක් එහි පිළිතුර ලෙස සඳහන් කර තිබුණේ 'මුදල් ප්‍රවාහ ප්‍රකාශය' වෙනුවට 'මුදල් පොත' යන්නයි. සැලසුම තුළින් අපේක්ෂිත ද ගණනය කිරීම කෙරෙන බව අවධාරණය කළ යුතුය. 19 ප්‍රශ්නය විවිධ මූල්‍ය මාර්ග යටතේ අවදානම හා ප්‍රතිලාභ ඇසුරින් සකසා තිබුණි. මෙය විෂය නිර්දේශයේ සඳහන් අවසාන නිපුණතාවේ නිපුණතා මට්ටමක් බැවින් එය ආවරණය නොවීම මෙසේ අඩු පිරිසක් නිවැරදි පිළිතුර සැපයීමට හේතු විය හැකිය. පාඩම් නිසි ලෙස සැලසුම් කිරීමෙන් මෙම තත්ත්වය වළක්වා ගත හැකිය.

ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයෙහි වූ 32, 37 හා 40 යන ප්‍රශ්නවලට හැර අනෙකුත් ප්‍රශ්නවලට 40%ට වඩා වැඩි පිරිසක් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. 32 ප්‍රශ්නය සකසා තිබුණේ ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ප්‍රතිඵලය අනාවරණය කිරීම යටතේ වූ සාමාජික මුදල් ගණනය කිරීම ඇසුරිනි. මෙය ද විෂය නිර්දේශයේ සඳහන් අවසාන නිපුණතාවකට අදාළ බැවින් බොහෝ විට මෙම කොටස නිසි ලෙස ආවරණය නොවීම මෙම ප්‍රශ්නයට අඩු පිරිසක් නිවැරදි පිළිතුරු සැපයීමට හේතු විය හැකිය. එසේම සපයා තිබූ තොරතුරු කියවා, නිවැරදි ලෙස අවබෝධ කර නොගෙන ඇති බවක් ද පෙනුණි. නිවැරදි පිළිතුර සඳහන් කර තිබුණේ 25%ක් පමණි. පන්තිකාමරය තුළ සිසුන්ව වැඩි වශයෙන් ක්‍රියාකාරකම්වල නිරත කිරීමෙන් මෙම තත්ත්වය මඟ හරවා ගත හැකිය. 37 ප්‍රශ්නය ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම යටතේ වූ මෙහෙයුම් වියදම් වර්ගීකරණය කර ගණනය කිරීම ඇසුරින් සැකසූ ප්‍රශ්නයකි. ලාභාලාභ ගිණුමේ දක්වන වියදම් උපචිත පදනමට අනුව නිවැරදි ශීර්ෂ යටතේ වර්ගීකරණය කර ගණනය කිරීම පිළිබඳව නිසි අවබෝධයක් නොමැති බව 29%ක් පමණක් නිවැරදි පිළිතුර දැක්වීමෙන් අනාවරණය වේ. වියදම් ශීර්ෂ යටතේ වර්ගීකරණය කිරීම පන්තිකාමරයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් අවබෝධ කළ යුතුය.

40 ප්‍රශ්නය ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය අනාවරණය කිරීම සඳහා පිළියෙළ කරන ශේෂ පත්‍රයේ මුළු වගකීම් ගණනය කිරීම පිළිබඳව විය. මෙහි නිවැරදි පිළිතුර සඳහන් කර තිබුණේ 35%ක් පමණි. මෙහිදී උපචිත වියදම් වගකීමක් ලෙස නොගැනීම වැඩි පිරිසකට නිවැරදි පිළිතුර තෝරා ගැනීමට අපහසු වීමට හේතු වී ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අන්තර්ගත කළ යුතු විවිධ අයිතම ඇතුළත්ව අභ්‍යාස කරවීම තුළින් සිසුන්ගේ මෙම නිපුණතාව වර්ධනය කළ හැකිවේ.

## 2.2. II ප්‍රශ්න පත්‍රය

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

- ⋆ **කාලය පැය 02යි.** (ප්‍රශ්න පත්‍රයට නියමිත පැය තුනක (03) කාලයෙන් පැය දෙකක් (02) II ප්‍රශ්න පත්‍රය සඳහා යොදා ගැනීම අපේක්ෂා කෙරිණි.)

- ⋆ II ප්‍රශ්න පත්‍රයේ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වන අතර, I හා II කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු වේ.

- ⋆ 1 ප්‍රශ්නය ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයෙන් ප්‍රශ්න 5කින් හා ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයෙන් ප්‍රශ්න 5කින් සමන්විත කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් යුක්ත වේ.
  I කොටස ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයෙන් ව්‍යූහගත ප්‍රශ්න 3කින් හා II කොටස ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයෙන් ව්‍යූහගත ප්‍රශ්න 3කින් සමන්විත වේ.

- ⋆ 1 ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 02 බැගින් ලකුණු **20**ක් ද, I හා II කොටස්වල එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු **40**ක් ද හිමි වේ.
  II ප්‍රශ්න පත්‍රය සඳහා හිමි අවසාන මුළු ලකුණු **60**කි.

2.2.2. **II** ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

> ★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක 2, 3, 4.1 හා 4.2 ඇසුරින් සකස් කර ඇත. අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.

## 1 ප්‍රශ්නය

**1.** ● පහත සඳහන් සිද්ධිය උපයෝගී කරගෙන අංක **(i)** සිට **(x)** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පිය උරුමයෙන් ලත් ඉඩම් හිමියකු වූ මහීපාල කලක් රජයේ ලිපිකරු සේවයේ නිරතව සිටියේ ය. ඔහු රැකියාව කරන අතරම සිය පවුලේ පරිභෝජනය සඳහා එළවලු හා පලතුරු වගාව ද කරන ලදී. වගාව කෙරෙහි ඇල්මක් දක්වූ ඔහු රැකියාවෙන් ඉවත් වී 2011.01.01 දින සිට පූර්ණ කාලීනව එළවලු හා පලතුරු වගා කිරීමේ ව්‍යාපාරයක නිරත විය. එදින වගාව සඳහා යෙදවූ ඔහුගේ ඉඩම්වල අගය රු. 500 000 ක් වූ අතර මුදලින් රු. 400 000 ක් ද යොදවන ලදී. 2011.01.05 දින වගාව සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට රු. 100 000 ක් ද එළවලු හා පලතුරු අලෙවි කිරීම සඳහා අලෙවිසැලක් ඉදි කිරීමට රු. 200 000 ක් ද ඔහු වැය කළේ ය. ඉතිරි මුදල බැංකු ජංගම ගිණුමක තැන්පත් කරන ලදී. මෙම ව්‍යාපාරය ක්‍රමයෙන් දියුණු වූ අතර ඔහු ගමේ වෙනත් කෘෂි නිෂ්පාදකයින්ගෙන් එළවලු හා පලතුරු මිලට ගෙන නගරයේ සිල්ලර වෙළඳසැල්වලට අලෙවි කළේ ය. 2011.03.01 දින මහීපාල රු. 500 000 ක බැංකු ණයක් ලබාගෙන එම මුදලින් ප්‍රවාහන කටයුතු සඳහා රු. 400 000 ක් වටිනා කුඩා ලොරි රථයක් මිලට ගත්තේ ය. සිය ව්‍යාපාර කටයුතු සඳහා සේවකයින් 4 දෙනෙකු බඳවා ගත් අතර එක් සේවකයකුගේ මාසික වැටුප රු. 10 000 ක් විය. මහීපාල සිය ව්‍යාපාරය 'මහී කෘෂි නිෂ්පාදන' නමින් ලියාපදිංචි කළේ ය. ක්‍රමයෙන් දියුණුවන මෙම ව්‍යාපාරයෙන් 2011.06.30 දිනෙන් අවසන් මාස 6 සඳහා ඔහු ලැබූ ශුද්ධ ලාභය රු. 120 000 ක් විය. මෙම ව්‍යාපාරය සඳහා වඩා හොඳ ස්ථාවරත්වයක් ද නීතිමය රැකවරණයක් ද සීමිත වගකීමක් ද ලබාගැනීම සඳහා තම ව්‍යාපාරය උචිත ව්‍යාපාර සංවිධාන ක්‍රමයකට පරිවර්තනය කිරීමට මහීපාල අදහස් කරයි.

(i) මහීපාලගේ ව්‍යාපාරය ඇසුරෙන් නිදසුන් දක්වමින් **සෘජු නිෂ්පාදනය** හා **වක්‍ර නිෂ්පාදනය** යන සංකල්ප පැහැදිලි කරන්න.

(ii) (අ) මහීපාලගේ ව්‍යාපාරය දැනට පවත්වාගෙන යනු ලබන්නේ කවර ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් යටතේ ද?
(ආ) එම සංවිධාන ක්‍රමයේ වාසි **දෙකක්** නම් කරන්න.

(iii) (අ) මහීපාලගේ ව්‍යාපාරය 'මහී කෘෂි නිෂ්පාදන' යනුවෙන් ලියාපදිංචි කරන ලද්දේ කුමන නීතියක් යටතේ ද?
(ආ) එසේ ලියාපදිංචි කළ යුත්තේ කිනම් ආයතනයක ද?

(iv) වාණිජ බැංකුවක ජංගම ගිණුමක් ආරම්භ කිරීම මගින් මහීපාලට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(v) (අ) මහීපාලගේ අපේක්ෂාවට අනුව මෙම ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමය කුමක් ද?
(ආ) ඔබ යෝජනා කරන සංවිධාන ක්‍රමයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(vi) මෙම ව්‍යාපාරය ආරම්භ කළ 2011.01.01 දිනට අදළ ගිණුම්කරණ සමීකරණය අගයයන් සහිතව දක්වන්න.

(vii) මෙහි දක්වෙන ජංගම ගිණුමේ මුදල් තැන්පත් කිරීම, මෙම ව්‍යාපාරයේ ගිණුම්වල සටහන් කරන ආකාරය දක්වන්න.

(viii) මහීපාලගේ ව්‍යාපාරයේ දැකිය හැකි අයභාර වියදමක් හා ප්‍රාග්ධන වියදමක් සඳහන් කරන්න.

(ix) මෙහි සඳහන් තොරතුරුවලට අනුව මෙම ව්‍යාපාරයේ 2011.01.01 දිනට හා 2011.06.30 දිනට ප්‍රාග්ධන ශේෂ වෙන වෙනම දක්වන්න.

(x) (අ) මෙම ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය ගණනය කිරීම සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශය කුමක් ද?
(ආ) මෙම ව්‍යාපාරයේ 2011.06.30 දිනට මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරන මූල්‍ය ප්‍රකාශය කුමක් ද?

*(ලකුණු 02 × 10 = 20 යි.)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1. (i) තම පරිභෝජනය සඳහාම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සෘජු නිෂ්පාදනය වේ

- මහීපාල සිය පවුලේ පරිභෝජනය සඳහා එළවලු හා පලතුරු වගා කරන ලදී.

හෝ

- මහීපාල සිය පවුලේ පරිභෝජනය සඳහා එළවලු හා පලතුරු වගා කිරීමයි.

(ලකුණු 01 යි)

වෙළඳපොළ සඳහා නිෂ්පාදනය කිරීම වක්‍ර නිෂ්පාදනය වේ.
මහීපාල අලෙවි කිරීම සඳහා එළවලු හා පලතුරු වගා කිරීම වක්‍ර නිෂ්පාදනයයි

(ලකුණු 01 යි)

(ii) (අ) කේවල ස්වාමි ව්‍යාපාර/ තනි ව්‍යාපාර/ ඒක පුද්ගල ව්‍යාපාර

(ලකුණු 01 යි)

(ආ) <u>වාසි</u>

1. පහසුවෙන් ඇරඹීම
2. ලාභය තනිව භුක්ති විඳීම
3. නීති රීතිවල බලපෑම අඩු වීම
4. ලියාපදිංචිය අනිවාර්ය නොවීම
5. ඉක්මනින් තීරණ ගැනීමට හැකි වීම
6. අවසන් කිරීම පහසු වීම

(ලකුණු 1/2 × 2 = 01 යි)

(iii) (අ) 1918 අංක 06 දරන ව්‍යාපාර නාම අඥා පනත

හෝ

ව්‍යාපාර නාම අඥා පනත

(ලකුණු 01 යි)

(ආ) පළාත් සභාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ කාර්යාලය/ අදාළ පළාත් සභාව/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

(ලකුණු 01 යි)

(iv)

1. අයිරා පහසුකම් ලබාගැනීමට හැකි වීම
2. චෙක්පත් මඟින් ගනුදෙනු කිරීමේ හැකියාව
3. ස්ථාවර නියෝග ක්‍රියාත්මක කළහැකි වීම
4. සෘජු ප්‍රේෂණ ලබාගත හැකි වීම
5. විවිධ පාර්ශවයන්ට ලැබෙන චෙක්පත් ගිණුමේ තැන්පත් කිරීමේ හැකියාව

(ලකුණු 1 × 2 = 02 යි)

(v) (අ) සීමාසහිත පෞද්ගලික සමාගම් / සීමාසහිත පොදු සමාගම්

(ලකුණු 01 යි)

(ආ)

1. වගකීම සීමාසහිත වීම
2. නෛතික පුද්ගලභාවය
3. අඛණ්ඩ පැවැත්ම
4. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගතහැකි වීම
5. වෙනත් වාසි

(ලකුණු 1/2 × 2 = 01 යි)

(vi)

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
| රු. 900,000 | = | රු. 900,000 | + | 0 |

හෝ

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | ප්‍රාග්ධනය | + | වගකීම් |
| රු. 500,000 | | | | |
| රු. 400,000 | = | රු. 900,000 | + | 0 |

හෝ

| | | |
|---|---|---|
| වත්කම් | = | ප්‍රාග්ධනය |
| රු. 500,000 | | රු. 900,000 |
| රු. 400,000 | | |

(ලකුණු 02 යි)

(vii) මුදල් පොතේ බැංකු තීරුව හර 100,000
මුදල් පොතේ මුදල් තීරුව බැර 100,000

හෝ

බැංකු ගිණුම හර 100,000
මුදල් ගිණුම බැර 100,000

මුදල් ගිණුම

| | |
|---|---|
| | බැංකු 100,000 |

බැංකු ගිණුම

| | |
|---|---|
| මුදල් 100,000 | |

හෝ

මුදල් පොත

| | මුදල් | බැංකු | | මුදල් | බැංකු |
|---|---|---|---|---|---|
| මුදල් | | 100,000 | බැංකු | 100,000 | |

(ලකුණු 02 යි)

(viii) අයභාර වියදම් - වැටුප් ගෙවීම/ ගැනුම්/ පලතුරු මිලට ගැනීම

(ලකුණු 01 යි)

ප්‍රාග්ධන වියදම් - උපකරණ මිලදී ගැනීම/ අලෙවි සැලක් ඉදි කිරීම / ලොරි රථයක් මිලදී ගැනීම

(ලකුණු 01 යි)

(ix) 2011.01.01 දිනට ප්‍රාග්ධන ශේෂය රු. 900,000

(ලකුණු 01 යි)

2011.06.30 දිනට ප්‍රාග්ධන ශේෂය රු. 1,020,000
(රු.900,000 + රු. 120,000)

(ලකුණු 01 යි)

(x) (අ) වෙළඳ හා ලාභාලාභ ගිණුම / ආදායම් ප්‍රකාශය

**(ලකුණු 01 යි)**

(ආ) ශේෂ පත්‍රය

**(ලකුණු 01 යි)**

| 01. | (i) | (ii) අ | (ii) ආ | (iii) අ | (iii) ආ | (iv) | (v) අ | (v) ආ | (vi) | (vii) | (viii) | (ix) | (x) අ | (x) ආ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 02 | 01 | 01 | 01 | 01 | 02 | 01 | 01 | 02 | 02 | 02 | 02 | 01 | 01 | $= \frac{20}{20}$ |

**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




1 ප්‍රශ්නය අනිවාර්ය වුවද ඊට පිළිතුරු සපයා ඇත්තේ 99.5%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 15%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 15%ක් වන අතර 24%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් 14ක් ඇති අතර i කොටස හා ii හි (අ), (ආ) අනුකොටස්වල පහසුතාව 75%කට වඩා වැඩි අතර vii, ix කොටස් හා x (අ) අනුකොටසෙහි පහසුතාව 40%ට වඩා අඩු වේ.

1 ප්‍රශ්නයට ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂය ක්ෂේත්‍ර දෙකෙන්ම ප්‍රශ්න ඇතුළත් විය. අනිවාර්ය ප්‍රශ්නයක් වුවද සුළු පිරිසක් මෙම ප්‍රශ්නයට ද පිළිතුරු සපයා නොතිබුණි. අපේක්ෂකයින්ගෙන් 76%ක් මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 20න් 6ක් හෝ ඊට වඩා ලබාගෙන තිබූ අතර ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලට ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලට වඩා සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලින් iii (ආ) හා v (අ), (ආ) යන අනුකොටස් හැර අනෙකුත් සියලුම කොටස් හා අනුකොටස්වලට අයදුම්කරුවන්ගෙන් 60%කට වඩා සාර්ථක පිළිතුරු සපයා තිබුණි. මෙම කොටස් මූලික සංකල්ප ඇසුරින් සැකසූ ප්‍රශ්නවලින් යුක්ත වීම මෙසේ සාර්ථකව පිළිතුරු සැපයීමට හේතු වී ඇත. iii (ආ) අනුකොටසෙහි වූ ප්‍රශ්නය ව්‍යාපාර ලියාපදිංචි කළ යුතු ආයතන පිළිබඳ ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නයෙහි පිළිතුරක් වූ ‘ප්‍රාදේශීය ලේකම් කාර්යාලය’ වෙනුවට බොහෝ අපේක්ෂකයින් ‘ප්‍රාදේශීය සභාව’ ලෙස ලියා තිබීම මෙම අනුකොටසෙහි පහසුතාව අඩුවීමට හේතු විය. පන්තිකාමරය තුළදී සිද්ධි හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් සිසුන් දැනුවත් කිරීමෙන් කරුණු තහවුරු කළ යුතුය. එසේම, පන්තිකාමරයෙන් බැහැරව ද පැවරුම් මගින් සිසුන්ගේ දැනුම හා අවබෝධය තීව්‍ර කිරීමට කටයුතු කිරීම ද අවශ්‍ය වේ.

ගිණුම්කරණය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලින් ix ප්‍රශ්නයට සාර්ථක පිළිතුරු සපයා තිබුණේ 29%ක් වැනි සුළු පිරිසකි. එය ගිණුම්කරණ සමීකරණය ඇසුරින් සැකසූ ප්‍රශ්නයක් විය. ගිණුම් කාලපරිච්ඡේදයක් ආරම්භයේ දී පවතින ප්‍රාග්ධන ශේෂය ගිණුම් කාලපරිච්ඡේදයක් අවසානයේ දී වෙනස්වීමට හේතුවන කරුණු පිළිබඳ අවබෝධය අඩුවීම මෙයට හේතුවක් වේ. 1 ප්‍රශ්නය බොහෝ විට මූලික සංකල්ප ඇසුරින් සැකසූ ප්‍රශ්නවලින් යුක්ත වුවද බොහෝ අපේක්ෂකයින් ඒවාට පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත්තේ ඒවා සිද්ධියක් හා සම්බන්ධ වී පවතින බැවිණි. එමනිසා පන්ති කාමරයේ දී මූලික සංකල්ප අවබෝධ කර දී ඒවා සිද්ධි අනුසාරයෙන් තහවුරු කළ යුතු වේ. එවිට සිසුන්ට සිද්ධියක් අධ්‍යයනය කිරීමේ දී එහි ඇතුළත් සංකල්ප හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

## 2 ප්‍රශ්නය

**I කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)**

**2.** (i) ව්‍යාපාර පරිසරය, අභ්‍යන්තර හා බාහිර වශයෙන් වර්ග කළ හැකිය. අභ්‍යන්තර පරිසරය අධ්‍යයනයෙන් හඳුනාගත හැකි **ශක්තීන් දෙකක්** ද බාහිර පරිසරය අධ්‍යයනයෙන් හඳුනාගත හැකි **අවස්ථා දෙකක්** ද සඳහන් කරන්න. *(ලකුණු 02 යි.)*

(ii) (අ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම් සම්බන්ධයෙන් බලපාන පනත කුමක් ද?

(ආ) සීමාසහිත පෞද්ගලික සමාගමක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව කොපමණ ද? *(ලකුණු 02 යි.)*

(iii) ළමා නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කාංචනා අදහස් කරයි. ඒ සඳහා ඇය විසින් පිළියෙල කරන ලද ව්‍යාපාර සැලැස්මෙන් උපුටා ගත් තොරතුරු කිහිපයක් පහත දක්වේ.

- ⁕ මාසයකදී නිපදවීමට අපේක්ෂිත නිමි ඇඳුම් ඒකක ගණන 100 කි.
- ⁕ ඇස්තමේන්තුගත මාසික පිරිවැය :

| | | |
|---|---|---|
| රෙදි | රු. | 30 000 |
| නූල්, බොත්තම් හා ලාංඡන | රු. | 1 500 |
| ඇඳුම් මෝස්තර නිර්මාණය කරන්නාගේ ගාස්තුව | රු. | 3 000 |
| ගෙවල් කුලී | රු. | 1 500 |
| විදුලිය, දුරකථන හා වෙනත් වියදම් | රු. | 2 000 |

- ⁕ මැහුම් කුලිය එක් නිමි ඇඳුමක් සඳහා රු. 100 කි.

(අ) කාංචනාගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මාසික මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(ආ) නිපදවන එක් නිමි ඇඳුමක ඇස්තමේන්තුගත නිෂ්පාදන වියදම ගණනය කරන්න.

(ඉ) 25% ක ලාභාන්තිකයක් තබාගෙන ළමා නිමි ඇඳුමක් විකිණීමට කාංචනා බලාපොරොත්තු වන්නේ නම්, එක් නිමි ඇඳුමක විකුණුම් මිල ගණනය කරන්න. *(ලකුණු $02 \times 3 = 06$ යි.)*

*(මුළු ලකුණු 10 යි.)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

2. (i) අභ්‍යන්තර පරිසර අධ්‍යයනයෙන් හඳුනාගත හැකි ශක්තීන්

- හොඳ මූල්‍ය ශක්තිය / සම්පත් සහිත වීම
- කළමනාකරණ හැකියාව
- කුසලතාවන්ගෙන් පිරි කළමනාකරුවන් හා සේවකයින් සිටීම
- හොඳ සැලැස්මක් හා දැක්මක් තිබීම
- හොඳ නායකත්වය

(ලකුණු $1/2 \times 2 = 01$ යි)

බාහිර පරිසර අධ්‍යයනයෙන් හඳුනාගතහැකි අවස්ථා

- ළමා ජනගහනය ඉහළ යාම
- වයස්ගත ජනගහනය ඉහළ යාම
- රටෙහි ආර්ථික සංවර්ධනය

- හිතකර ආර්ථික ප්‍රතිපත්ති
- ව්‍යාපාරවලට හිතකර නීති රීති
- කාන්තාවන් රැකියාවල නියැලීම
- සෞඛ්‍යය ආරක්ෂා කිරීම
- දේශීය බව අගය කිරීම
- සාමය

**(ලකුණු 1/2 × 2 = 01 යි)**

(ii) (අ) 2007 අංක 07 දරන සමාගම් පනත / සමාගම් පනත

**(ලකුණු 01 යි)**

(ආ) එක් අයෙකි

**(ලකුණු 01 යි)**

(iii)

| | (රු.) |
|---|---|
| රෙදි | 30,000 |
| නූල්, බොත්තම් හා ලාංඡන | 1,500 |
| මෝස්තර නිර්මාණ ගාස්තු | 3,000 |
| ගෙවල් කුලී | 1,500 |
| විදුලිය, දුරකථන හා වෙනත් | 2,000 |
| මැහුම් කුලිය | 10,000 |
| | 48,000 |

(අ) මුළු නිෂ්පාදන පිරිවැය රු. 48,000

**(ලකුණු 02 යි)**

**(අයිතම පහකට (05) ලකුණු 01)**

(ආ) එක් ඇඳුමක වියදම $= \frac{48,000}{100} =$ රු. 480

**(ලකුණු 02 යි)**

(ඉ) ඇඳුමක විකුණුම් මිල $= 480 \times \frac{125}{100} =$ රු. 600

**හෝ**

ඇඳුමක විකුණුම් මිල $= 480 + (480 \times \frac{25}{100})$

$= 480 + 120 =$ රු. 600

**(ලකුණු 02 යි)**

| 02. | (i) | (ii) අ | (ii) ආ | (iii) අ | (iii) ආ | (iii) ඉ | |
|---|---|---|---|---|---|---|---|
| | 02 | 01 | 01 | 02 | 02 | 02 | $= \frac{10}{10}$ |

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




2 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 64%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ. ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 20%ක් ද, ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 30%ක් ද, ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 22%ක් ද, ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 28%ක් වන අතර 20%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි කොටස් හා අනු කොටස් 6ක් ඇති අතර ii (අ) අනු කොටසෙහි පහසුතාව 75%කට වඩා වැඩි අතර ii (ආ) අනුකොටසෙහි පහසුතාව 40%ට වඩා අඩු වේ.

මෙම ප්‍රශ්නය ව්‍යාපාර පරිසර සාධක, ව්‍යාපාර සංවිධාන හා ව්‍යාපාර සැලසුම ඇසුරින් සකස් කර තිබුණි. මෙහි ii (ආ) අනුකොටසට හැර අනෙකුත් සියලුම කොටස්වලට 50%කට වඩා වැඩි පිරිසක් සාර්ථක පිළිතුරු සපයා තිබූ අතර ii (අ) අනුකොටසට 80%ක පිරිසක් සාර්ථක පිළිතුරු සපයා තිබුණි. මෙම අනුකොටසට මෙසේ වැඩි පිරිසක් ලකුණු ලබා ගැනීමට හේතුව, එම නිපුණතාව වඩා හොඳින් අවබෝධ කරගෙන තිබීමයි.

මෙහි පහසුතාව අඩුම ප්‍රශ්නය වී ඇත්තේ ii (ආ) අනුකොටස ය. මෙය ව්‍යාපාර සංවිධාන වර්ග ඇසුරින් වූ ප්‍රශ්නයකි. එක් එක් ව්‍යාපාර සංවිධාන වර්ගයක් ආරම්භ කිරීමට අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව වගුගත කිරීම තුළින් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වැනි අභ්‍යාසවල සිසුන් යෙදවීම තුළින් මෙම විෂය කරුණු වඩා හොඳින් තහවුරු කළ හැකිය.

iii කොටසෙහි වූ ව්‍යාපාර සැලසුම ආශ්‍රයෙන් වූ ප්‍රශ්නවලදී, අපේක්ෂකයින් දී තිබූ සිද්ධිය හොඳින් අධ්‍යයනය කළේ නම් මෙයට වඩා සාර්ථකව පිළිතුරු සැපයීමට හැකි වනු ඇත. මෙම ප්‍රශ්නයේ පිරිවැය ගණනයේ දී 'මැහුම් කුලිය' ගණනය කර පිරිවැයට එකතු නොකිරීම නිසා බොහෝ අපේක්ෂකයින්ට නිවැරදි පිළිතුරු සැපයීමට නොහැකි වී තිබුණි. සිද්ධි හා විවිධ තොරතුරු ඇතුළත් අභ්‍යාසවල සිසුන් වැඩි වශයෙන් නිරත කරවීම තුළින් විවිධ පිරිවැය පිළිබඳ මනා අවබෝධයක් ලබාදීමෙන් මෙම නිපුණතාව වර්ධනය කළ හැකි වේ.

3 ප්‍රශ්නය

**3.** (i) (අ) **චෙක්පත යනු කුමක් දැයි හඳුන්වන්න.**

(ආ) **චෙක්පතක ඇතුළත් මූලික ලක්ෂණ හතරක් සඳහන් කරන්න.**

(ii) **ස්වයංක්‍රීය බැංකු සේවා යන්ත්‍ර (ATM) ප්‍රචලිත බැංකු සේවාවකි. මෙම ATM යන්ත්‍ර මගින් බැංකු ගනුදෙනුකරුවෙකුට ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.**

(iii) **ජීවිත රක්ෂණය හා අනෙකුත් රක්ෂණ වර්ග අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.**

(iv) **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය නිසා විද්‍යුත් සන්නිවේදන ක්‍රම රාශියක් භාවිතයට පැමිණ ඇත. මෙවැනි සන්නිවේදන ක්‍රම හතරක් නම් කරන්න.**

(v) **ව්‍යාපාරිකයෙකුට ගබඩාකරණයෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.** *(ලකුණු 02 × 5 = 10 යි.)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

3. (i) (අ) වාණිජ බැංකුවක ජංගම ගිණුම් හිමියෙකු තම ගිණුමේ ඇති මුදලින් සඳහන් කර ඇති මුදල් ප්‍රමාණය නම සඳහන් පුද්ගලයාට හෝ රැගෙන එන්නාට ගෙවන ලෙස තම බැංකුවට කරනු ලබන ලිඛිත නියෝගයකි.

(ලකුණු 01 යි)

(ආ)
1. බැංකුව හා බැංකු ශාඛාවේ නම
2. චෙක්පත් අංකය
3. බැංකුවේ අංකය
4. ජංගම ගිණුමේ අංකය
5. හෝ රැගෙන එන්නාට යන පදය
6. දිනය
7. මුදල අකුරින් හා ඉලක්කමෙන්
8. අණකරුගේ අත්සන
9. ආදායකයාගේ නම

(කරුණු 4 කට ලකුණු 01 යි.
2 හෝ 3 කට ලකුණු 1/2 යි)

(ii) ATM මගින් ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රයෝජන
1. මුදල් තැන්පත් කිරීම
2. මුදල් ආපසු ගැනීම
3. ගිණුම් අතර මුදල් මාරු කිරීම
4. ගිණුමේ ශේෂය බලාගැනීම
5. කාලය ඉතිරි වීම
6. දවසේ පැය විසිහතර පුරාම ක්‍රියාත්මක වීම
7. ආරක්ෂාව

(එක් කරුණකට 1/2 යි බැගින්
කරුණු 4 කට ලකුණු 2 යි)

(iii)

| ජීවිත රක්ෂණය | අනෙකුත් රක්ෂණ |
|---|---|
| 1. අවදානම නිශ්චිත වේ.<br>2. ජීවිත රක්ෂණ ඔප්පුවේ වටිනාකම ගෙවීමේ හැකියාව මත තීරණය වේ.<br>3. රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකිය.<br>4. ආයෝජනයකට සමාන ප්‍රතිලාභ ඇත.<br>5. ජීවිතයට හානියක් සිදුවුවත් නැතත් රක්ෂණ මුදල ලබාගත හැකිය.<br>6. හානිපූරණ මූලධර්මය අදාළ නොවේ. | 1. අවදානම නිශ්චිත නොවේ.<br>2. රක්ෂණ ඔප්පුවේ වටිනාකම දේපල වටිනාකම මත තීරණය වේ.<br>3. රක්ෂණ ඔප්පුව පැවරිය හැකිය.<br>4. ප්‍රතිලාභ නොලැබේ.<br>5. දේපලට හානියක් සිදුවූ විට පමණක් වන්දි ලැබේ.<br>6. හානිපූරණ මූලධර්මය අදාළ ය. |

**(එක් වෙනසකට ලකුණු 01 බැගින්**
**වෙනස්කම් 2 කට ලකුණු 2 යි)**

(iv) විද්‍යුත් සන්නිවේදන ක්‍රම
1. ජංගම දුරකථන/ දුරකථනය
2. වීඩියෝ පට
3. විද්‍යුත් තැපෑල
4. ෆැක්ස් (Fax)
5. අන්තර්ජාලය
6. කෙටි පණිවිඩ සේවාව (S.M.S.)
7. අන්තර්ජාල සංවාද (Skype)
8. වෙනත් (පිළිගත හැකි ක්‍රම) ගුවන් විදුලිය/ රූපවාහිනිය/ හඬ තැපැල

**(ලකුණු 1/2 × 4 = 02 යි)**

(v) ගබඩාකරණයෙන් ලැබෙන ප්‍රයෝජන
1. නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම
2. බෙදාහැරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම
3. ඉල්ලුම හා සැපයුම සමතුලිතව පවත්වාගෙන යාම
4. නිෂ්පාදන කටයුතු කාලීනව සිදුවන අවස්ථාවලදී ඒවා රැස්කර තබා ගැනීම
5. නියමිත කාලවලදී ඇණවුම් කිරීමට හැකි වීම
6. සුවිශේෂ කාලවල වෙළෙඳපල ඉල්ලුම අවශ්‍යතා සපුරාලීම
7. පිරිවැය පාලනය කිරීම

**(එක් ප්‍රයෝජනයකට ලකුණු 1/2 බැගින්**
**ප්‍රයෝජන 4 කට ලකුණු 2 යි)**

| 03. | (i) අ | (i) ආ | (ii) | (iii) | (iv) | (v) | |
|---|---|---|---|---|---|---|---|
| | 01 | 01 | 02 | 02 | 02 | 02 | = $\frac{10}{10}$ |

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




3 ප්‍රශ්නය 88%ක පිරිසක් තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 30%ක් වන අතර 10%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් 6ක් ඇති අතර ii, iv, v කොටස්වල පහසුතාව 60%කට වඩා වැඩි අතර i (අ) අනුකොටසෙහි පහසුතාව 40%ට වඩා අඩු වේ.

ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය සේවා ඇසුරින් මෙම ප්‍රශ්නය සකස් කර තිබුණි. අනෙකුත් ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලට වඩා මෙම ප්‍රශ්නය වැඩි අපේක්ෂක සංඛ්‍යාවක් තෝරාගෙන තිබුණි. ප්‍රශ්නයට හිමි ලකුණු 10න් 6ක් හෝ ඊට වඩා වැඩි ලකුණු ලබාගත් පිරිස 58%ක් විය. අඩුම පහසුතාවක් ඇති i (අ) අනු කොටසට අදාළ චෙක්පතක් අර්ථ දැක්වීමේ දී 'ලිඛිත නියෝගය' යන වචන ඇතුළත් නොවීම ලකුණු අහිමි වීමට හේතුවක් විය. කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් ආදර්ශ චෙක්පත් ඇසුරින් චෙක්පතක් නිර්වචනය කිරීමට අවශ්‍ය තොරතුරු ගොනු කරවීම වඩාත් සුදුසු වේ.

3 ප්‍රශ්නයේ ඇතුළත් වනුයේ ප්‍රායෝගික භාවිතයේ පවතින දෑ පිළිබඳ සැකසුණු ප්‍රශ්න බැවින් ii, iii, iv හා v කොටස් අයදුම්කරුවන් වැඩි පිරිසකට පහසු වී ඇත.

4 ප්‍රශ්නය

**4.** (i) **සීතා කුඩා කළ සිටම තමාගේ ඉතිරිකිරීමේ ගිණුමේ මුදල් තැන්පත් කර, ඉතිරිකර ගත් රු. 200 000 ක මුදල ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීමට අදහස් කරන්නී ය. එහෙත් ඇයගේ සොහොයුරා පවසන්නේ එම මුදල කොටස් වෙළඳපොළෙන් සාමාන්‍ය කොටස් මිලදී ගැනීමට යෙදවීම සුදුසු බවයි. මවගේ අදහස වන්නේ එම මුදල් ආපසු නොගෙන ඉතිරිකිරීමේ ගිණුමේම පවත්වාගෙන යාම සුදුසු බවයි.**

**(අ) සීතාගේ අදහස ක්‍රියාත්මක කළහොත් ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.**

**(ආ) සොහොයුරාගේ අදහස ක්‍රියාත්මක කළහොත් ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.**

**(ඉ) ඉහත යෝජනාවලට අමතරව සීතා සතු මුදල ආයෝජනය කළ හැකි වෙනත් වඩා හොඳ ආයෝජන මාර්ගයක් යෝජනා කර, එයට හේතු දක්වන්න.** *(ලකුණු 02 × 3 = 06 යි.)*

(ii) **ව්‍යාපාරයක මූල්‍ය අවශ්‍යතා, දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා හා කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා ලෙස වර්ග කළ හැකිය. දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාගත හැකි මාර්ගයක් හා කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාගත හැකි මාර්ගයක් සඳහන් කරන්න.** *(ලකුණු 02 යි.)*

(iii) **'ආයෝජන කළඹ' යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?** *(ලකුණු 02 යි.)*

*(මුළු ලකුණු 10 යි.)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

4. (i) (අ) ස්ථාවර තැන්පතුවක ප්‍රතිලාභ

1. ඉතුරුම් තැන්පත්වලට වඩා ඉහළ පොලියක් හිමි වේ.
2. තැන්පත් කාලය වැඩිවන විට පොලිය ඉහළ ය.
3. ගිවිසගත් කාලය අවසානයේදී නිශ්චිත පොලියක් හිමි වේ.
4. ස්ථාවර තැන්පත් සහතිකය ඇපයට තබා ණය මුදලක් ලබාගැනීමට හැකි වීම.
5. පොලිය මාසිකව ද ලබා ගත හැකිවීම.
6. අවදානම අඩුවීම.

(ලකුණු 01 × 02 = 02 යි)

(ආ) සාමාන්‍ය කොටස් ආයෝජනයේ ප්‍රතිලාභ

1. ලාභය ගණනය කිරීමෙන් පසු ලාභාංශ හිමි වේ.
2. ප්‍රාග්ධන ලාභ ලැබීම.
3. ප්‍රසාද කොටස් හිමි වේ.
4. හිමිකම් කොටස් වරප්‍රසාදය
5. සමාගමේ පාලන බලතල හිමි වේ.
6. ඡන්ද බලය හිමිවීම.
7. කොටස් පැවරීමට හැකිවීම.
8. සුරැකුම් ලෙස ඉදිරිපත් කළ හැකිවීම.

(ලකුණු 01 × 02 = 02 යි)

(ඉ) අමතර ආයෝජන මාර්ග

1. ආයෝජන කළඹ
2. ඒකකභාර අරමුදල්
3. භාණ්ඩාගාර බිල්පත්
4. භාණ්ඩාගාර බැඳුම්කර
5. දේපල මිලට ගැනීම

ආයෝජන මාර්ගය යොජනා කිරීමට හේතුව

1. අවදානම
2. ප්‍රතිලාභ

3. ආරක්ෂාව
4. ද්‍රවශීලතාවය

**(ආයෝජන මාර්ගයකට ලකුණු 01 යි.**
**හේතු දෙකකට ලකුණු 1/2 × 02 = 01 යි)**

(ii) දිගුකාලීන :
1. කොටස් නිකුත් කිරීම
2. ණයකර නිකුත් කිරීම
3. දිගුකාලීන බැංකු ණය
4. උකස් ණය
5. කල්බදු පහසුකම්

කෙටිකාලීන :
1. බැංකු අයිරා
2. කෙටිකාලීන බැංකු ණය
3. පෞද්ගලික ණය
4. වෙළෙඳ ණය

**(කරුණු 1 කට ලකුණු 01 යි)**

(iii) ආයෝජකයන්ට තමා සතු මුදල් විවිධ ආයෝජන මාර්ගවල යෙදවීමට අවස්ථාව සැලසෙන ආකාරය ආයෝජන කළඹ තුළින් හඳුනාගත හැක. එමඟින් ආයෝජනයේ අවදානම අඩු කරගැනීමට හැකි වීම

**(ලකුණු 02 යි)**

| 04. | (i) අ | (i) ආ | (i) ඉ | (ii) | (iii) | |
|---|---|---|---|---|---|---|
| | 02 | 02 | 02 | 02 | 02 | = $\frac{10}{10}$ |

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




4 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 47%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 39%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 16%ක් වන අතර 39%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස් 5ක් ඇති අතර i (අ) හා (ආ) අනුකොටස්වල පහසුතාව 50%කට වඩා වැඩි අතර i (ඉ) අනුකොටසෙහි හා ii, iii කොටස්වල පහසුතාව 50%ට වඩා අඩු වේ.

මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණේ අපේක්ෂකයින්ගෙන් 47%ක් පමණි. මෙය විෂය නිර්දේශයේ අවසාන නිපුණතාව වන විවිධ මූල්‍ය මාර්ග ඇසුරින් ගොඩ නඟා තිබූ ප්‍රශ්නයකි. පිළිතුරු සැපයීමේ දී මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10න් 6ක් හෝ ඊට වඩා ලබාගෙන තිබුණේ 30%ක් පමණි. i (අ), (ආ) අනුකොටස් ප්‍රායෝගිකව ප්‍රචලිත වී ඇති ආයෝජන අවස්ථා පිළිබඳ වූ ප්‍රශ්න බැවින් අපේක්ෂකයින් වැඩි පිරිසක් ඒවාට නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

ආයෝජන මාර්ග පිළිබඳව න්‍යායාත්මක දැනුම අඩුවීම නිසා i (ඉ) අනුකොටසට හා ii, iii කොටස් පහසු වී තිබුණේ අඩු පිරිසකට ය. මේ සඳහා ආයෝජන මාර්ග හා සම්බන්ධ නිපුණතාව වර්ධනය කිරීම සඳහා සිසුන්ව පුවත්පත් හා සඟරා කියවීමට සැලැස්වීම, විවිධ සම්මන්ත්‍රණවලට සහභාගි කරවීම, බැංකු හා මූල්‍ය ආයතනවලින් ලබාදෙන අත් පත්‍රිකා කියවීමට උනන්දු කරවීම වැනි ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදවීම අවශ්‍ය වේ. මෙම නිපුණතාව පන්තිකාමරය තුළදී අනෙකුත් නිපුණතාවලට සාපේක්ෂව අධ්‍යයනය නොකර තිබීමේ ස්වභාවයක් විද්‍යමාන වේ. මෙය විෂය නිර්දේශයේ අවසාන නිපුණතාව වීම මෙයට එක් හේතුවක් විය හැකිය. එබැවින් එම නිපුණතාව හොඳින් ආවරණය කිරීමට කල්තබා සැලසුම් කිරීම ගුරුවරුන්ගේ වගකීමකි.

5 ප්‍රශ්නය

**II කොටස - ගිණුම්කරණය**

**(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)**

**5.** 2011.03.01 දින අනිල් විසින් ආරම්භ කළ සිල්ලර බඩු ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2011.03.01 | ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදීම | රු. | 250 000 |
| 2011.03.07 | කාර්යාල උපකරණ මිලදී ගැනීම | රු. | 28 000 |
| 2011.03.12 | භාණ්ඩ අත්පිට මුදලට ගැනීම | රු. | 140 000 |
| 2011.03.22 | භාණ්ඩ අත්පිට මුදලට විකිණීම | රු. | 30 000 |
| 2011.03.23 | භාණ්ඩ තොගයක් ආශාගෙන් ණයට ගැනීම | රු. | 50 000 |
| 2011.03.28 | නන්දනට ණයට භාණ්ඩ විකිණීම | රු. | 40 000 |
| 2011.03.30 | අනිල් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් මුදල් ගැනීම | රු. | 2 500 |

**අවශ්‍යවන්නේ :**

(1) ඉහත ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කර, 2011.03.31 දිනට ගිණුම් තුලනය කිරීම *(ලකුණු 07 යි.)*

(2) 2011.03.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කිරීම *(ලකුණු 03 යි.)*

*(මුළු ලකුණු 10 යි.)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

5. (1)

මුදල් පොත

| | | | | | |
|---|---|---|---|---|---|
| 3/1 | ප්‍රාග්ධනය | 250,000 | 3/7 | කාර්යාල උපකරණ | 28,000 |
| 3/22 | අත්පිට විකුණුම් | 30,000 | 3/12 | අත්පිට ගැණුම් | 140,000 |
| | | | 3/30 | ගැනිලි | 2,500 |
| | | | 3/31 | ශේෂය ප/ගෙ | 109,500 |
| | | 280,000 | | | 280,000 |
| 4/1 | ශේෂය ඉ/ගෙ | 109,500 | | | |

ප්‍රාග්ධන ගිණුම

| | | | |
|---|---|---|---|
| | | 3/1 මුදල් | 250,000 |
| 3/31 ශේෂය ප/ගෙ | 250,000 | | |
| | 250,000 | | 250,000 |
| | | 4/1 ශේෂය ඉ/ගෙ | 250,000 |

කාර්යාල උපකරණ ගිණුම

| | | | |
|---|---|---|---|
| 3/7 මුදල් | 28,000 | | |
| | | 3/31 ශේෂය ප/ගෙ | 28,000 |
| | 28,000 | | 28,000 |
| 4/1 ශේෂය ඉ/ගෙ | 28,000 | | |

**විකුණුම් ගිණුම**

| | | | |
|---|---|---|---|
| | | 3/22 මුදල් | 30,000 |
| 3/31 ශේෂය ප/ගෙ | 70,000 | 3/28 ණයගැති (නන්දන) | 40,000 |
| | 70,000 | | 70,000 |
| | | 4/1 ශේෂය ඉ/ගෙ | 70,000 |

**ගැනුම් ගිණුම**

| | | | |
|---|---|---|---|
| 3/12 මුදල් | 140,000 | 3/31 ශේෂය ප/ගෙ | 190,000 |
| 3/23 ණයහිමි (ආශා) | 50,000 | | |
| | 190,000 | | 190,000 |
| 4/1 ශේෂය ඉ/ගෙ | 190,000 | | |

**ආශාගේ ගිණුම (ණයහිමි)**

| | | | |
|---|---|---|---|
| | | 3/23 ගැණුම් | 50,000 |
| 3/31 ශේෂය ප/ගෙ | 50,000 | | |
| | 50,000 | | 50,000 |
| | | 4/1 ශේෂය ඉ/ගෙ | 50,000 |

**නන්දනගේ ගිණුම (ණයගැති)**

| | | | |
|---|---|---|---|
| 3/28 විකුණුම් | 40,000 | 3/31 ශේෂය ප/ගෙ | 40,000 |
| | 40,000 | | 40,000 |
| 4/1 ශේෂය ඉ/ගෙ | 40,000 | | |

**ගැනිලි ගිණුම**

| | | | |
|---|---|---|---|
| 3/30 මුදල් | 2,500 | 3/31 ශේෂය ප/ගෙ | 2,500 |
| | 2,500 | | 2,500 |
| 4/1 ශේෂය ඉ/ගෙ | 2,500 | | |

**නිවැරදි ද්විත්ව සටහන් එකකට 1/2 බැගින් (1/2 × 7) ලකුණු 03 1/2 යි**
**නිවැරදි තුලනය කිරීමේ ගිණුමකට 1/2 බැගින් ලකුණු 03 1/2 යි**

(2) **2011.03.31 දිනට ශේෂ පිරික්සුම**

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| මුදල් | 109,500 | |
| ප්‍රාග්ධනය | | 250,000 |
| කාර්යාල උපකරණ | 28,000 | |
| ගැණුම් | 190,000 | |
| අත්පිට විකුණුම් | | 70,000 |
| ණයහිමියෝ (ආශා) | | 50,000 |
| ණයගැතියෝ (නන්දන) | 40,000 | |
| ගැනිලි | 2,500 | |
| | 370,000 | 370,000 |

**නිවැරදි ශේෂ දෙකකට 1/2 බැගින් ශේෂ 8 කට (1/2 × 4) ලකුණු 02 යි**
**නිවැරදි එකතුවට ලකුණු 01 යි**

| 05. | (1) | (2) | |
|---|---|---|---|
| | 07 | 03 | $= \frac{10}{10}$ |

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




5 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 68%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 17%ක් වන අතර 50%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.

**ප්‍රශ්නයේ කොටස්වල පහසුතාව**




**5 ප්‍රශ්නයෙහි කොටස්**

මෙම ප්‍රශ්නයෙහි කොටස් 2ක් ඇති අතර
1 කොටසෙහි පහසුතාව 40%ක් වන අතර
2 කොටසෙහි පහසුතාව 36%කි.

මෙම ප්‍රශ්නය අපේක්ෂකයින්ගෙන් 68%ක් තෝරාගෙන තිබූ අතර ඔවුන්ගෙන් වැඩි කොටසක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත. ප්‍රශ්නයට හිමි ලකුණු 10න් 6ක් හෝ ඊට වඩා වැඩි ලකුණු ලබාගෙන ඇත්තේ 28%ක් පමණි. ද්විත්ව සටහන් පිළිබඳ නිසි අවබෝධයක් නොතිබීම හේතුවෙන් 1 කොටස පහසුවී ඇත්තේ 40%කට පමණි. ද්විත්ව සටහන් නිවැරදිව ගොඩ නැංවීමට අවශ්‍ය ලිඛිත අභ්‍යාස කරවීම හා ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබාදීම වඩාත් සුදුසු වේ. මුදල් පොතේ ද්විත්ව කාර්ය හඳුනා නොගැනීම ද තවත් දුර්වලතාවයකි. පළමු පියවරේදී මුදල් ගිණුම ලෙස ද දෙවන පියවරේ දී උපයෝගී පොතක් වශයෙන් ද හඳුන්වා දීමෙන් මෙම නිපුණතාව ප්‍රගුණ කළ හැකිය. ද්විත්ව සටහන් ගොඩ නැංවීමේ දී එකවරම ද්විත්ව සටහන් තැබීමට සිසුන්ව පුහුණු කිරීමෙන් ද ද්විත්ව සටහන් නිවැරදිව ඉදිරිපත් කිරීම හුරු කළ හැකිය.

මෙම ප්‍රශ්නයේ 2 කොටසට අඩු ලකුණු ලැබීමට හේතුවක් ලෙස ලෙජර් ගිණුම් තුලනය කිරීමේ නිපුණතා මට්ටමට ළඟා වී නොතිබීම හේතු විය හැකිය. අදාළ අයිතම ලෙජර් ගිණුම්වල ඇතුළත් කළ ද ලෙජර් ගිණුම් නිවැරදිව ශේෂ කිරීමේ අවශ්‍යතාව අවබෝධ කරගෙන නොතිබුණු බවක් පෙනුණි. ලෙජර් ගිණුම් තුලනය කිරීමේ නිපුණතාව සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් පුහුණු කිරීමෙන් හා ප්‍රතිපෝෂණ ලබා දීමෙන් ප්‍රගුණ කළ හැකි වේ.

## 6 ප්‍රශ්නය

**6.** සඳරුවන්ගේ ව්‍යාපාරයේ 2011 ඔක්තෝබර් මාසය සඳහා මුදල් පොතේ බැංකු තීරුව පහත දැක්වේ.

**මුදල් පොත**

| දිනය | විස්තරය | බැංකු (රු.) | දිනය | විස්තරය | බැංකු (රු.) |
|---|---|---|---|---|---|
| 2011.10.01 | ඉ/ගෙ/ ශේෂය | 50 000 | 2011.10.05 | චෙක්පත් නිකුත් කිරීම් : | |
| 2011.10.03 | මුදල් තැන්පත් | 9 000 | | 168400 (කපිල) | 5 000 |
| 2011.10.07 | චෙක්පත් තැන්පත්: | | | 168401 (සමන්) | 40 000 |
| | 323510 (ජයසිරි) | 15 000 | 2011.10.10 | චෙක්පත් නිකුත් කිරීම් : | |
| 2011.10.26 | චෙක්පත් තැන්පත්: | | | 168402 (රක්ෂණය) | 5 000 |
| | 236427 (නුවන්) | 30 000 | | 168403 (ගෙවල් කුළී) | 10 000 |
| | 348205 (කමනී) | 50 000 | 2011.10.31 | ප/ගෙ ශේෂය | 94 000 |
| | | 154 000 | | | 154 000 |

සඳරුවන්ගේ ව්‍යාපාරයට 2011 ඔක්තෝබර් මාසය සඳහා බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනයෙන් උපුටාගත් කොටසක් පහත දැක්වේ.

| දිනය | විස්තරය | ගෙවීම් (රු.) | ලැබීම (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 2011.10.01 | ඉ/ගෙ ශේෂය | - | - | 50 000 |
| 2011.10.03 | මුදල් තැන්පත් | - | 9 000 | 59 000 |
| 2011.10.06 | චෙක්පත් ගෙවීම් 168401 | 40 000 | - | 19 000 |
| 2011.10.09 | චෙක්පත් තැන්පතු 323510 | - | 15 000 | 34 000 |
| 2011.10.10 | ස්ථාවර නියෝග | 4 000 | - | 30 000 |
| 2011.10.11 | චෙක්පත් ගෙවීම් 168402 | 5 000 | - | 25 000 |
| 2011.10.16 | ප්‍රේෂණ | - | 7 000 | 32 000 |
| 2011.10.25 | ලාභාංශ | - | 500 | 32 500 |
| 2011.10.28 | බැංකු ගාස්තු | 1 000 | - | 31 500 |

**අවශ්‍යවන්නේ :**

(1) 2011.10.31 දිනට මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කිරීම *(ලකුණු 05 යි.)*

(2) 2011.10.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම *(ලකුණු 05 යි.)*

*(මුළු ලකුණු 10 යි.)*

6. (1)

**සංශෝධිත මුදල් පොත (බැංකු තීරුව)**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10/30 | ශේෂය ඉ/ගෙ | 94,000 | (1/2) | ස්ථාවර නියෝග | 4,000 | (01) |
| | ප්‍රේෂණ | 7,000 | (01) | බැංකු ගාස්තු | 1,000 | (01) |
| | ලාභාංශ | 500 | (01) | සංශෝධිත ශේෂය ප/ගෙ | 96,500 | (1/2) |
| | | 101,500 | | | 101,500 | |
| 11/01 | සංශෝධිත ශේෂය ඉ/ගෙ | 96,500 | | | | |

**(ලකුණු 05 යි)**

**සඳරුවන්ගේ ව්‍යාපාරය**

**2011.10.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය**

| | (රු.) | (රු.) |
|---|---|---|
| 2011.10.31 දිනට සංශෝධිත මුදල් පොතට අනුව බැංකු ශේෂය (1/2) | | 96,500 |
| <u>එකතු කළා</u> | | |
| නිකුත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් | | |
| 168400 (කපිල) | 5,000 (01) | |
| 168403 (ගෙවල් කුළී) | 10,000 (01) | 15,000 |
| <u>අඩු කළා</u> | | 111,500 |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | | |
| 236427 (නුවන්) | 30,000 (01) | |
| 348205 (කමනී) | 50,000 (01) | 80,000 |
| 2011.10.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය (1/2) | | 31,500 |

**(ලකුණු 05 යි)**

| 06. | (1) | (2) | |
|---|---|---|---|
| | 05 | 05 | $= \frac{10}{10}$ |

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




6 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 54%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 9%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 50%ක් වන අතර 24%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි කොටස් 2ක් ඇති අතර 1 කොටසෙහි පහසුතාව 77%ක් වන අතර 2 කොටසෙහි පහසුතාව 70%ක් වේ.

මෙම ප්‍රශ්නය බැංකු සැසඳුම් පිළියෙල කිරීම යන නිපුණතා මට්ටම ඇසුරින් ගොඩ නඟා තිබුණි. අපේක්ෂකයින්ගෙන් 54%ක් මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණි. පන්තිකාමරය තුළ ප්‍රායෝගිකව අභ්‍යාසවල නිරත වූ අපේක්ෂකයින් මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබූ බව වැඩි පිරිසක් නිවැරදි පිළිතුරු සපයා තිබීමෙන් පෙනී යයි. 1 කොටසෙහි පහසුතාව 77%ක් ද, 2 කොටසෙහි පහසුතාව 70%ක් ද වී ඇත. බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම පිළිබඳව වැඩි වශයෙන් අභ්‍යාස කරවීමෙන් සාධන මට්ටම තවදුරටත් ඉහළ නංවා ගැනීමට හැකි වේ. පන්තිකාමරය තුළ මෙම නිපුණතාව මීට වඩා අධ්‍යයනය කර තිබුණේ නම් මෙම ප්‍රශ්නය 54%කට වඩා වැඩි පිරිසක් තෝරා ගැනීමටත් සාර්ථක පිළිතුරු සැපයීමටත් ඉඩ තිබුණි. බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා ඒ පිළිබඳ අවබෝධය ආයතනවලට පමණක් නොව පුද්ගලයින්ට ද වැදගත් වන බැවින් පැවරුම් තුළින් දැනුම භාවිත කිරීමට අවස්ථා සම්පාදනය කිරීම යෝග්‍ය වේ.

7 ප්‍රශ්නය

7. රවිඳුගේ ව්‍යාපාරයේ 2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ ගිණුම පිළියෙල කිරීමෙන් පසු සකස් කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| දළ ලාභය | | 191 500 |
| ප්‍රාග්ධනය - 2010.01.01 දිනට | | 250 000 |
| බඩු තොගය - 2010.12.31 දිනට | 8 400 | |
| ඉඩම් හා ගොඩනැඟිලි (පිරිවැයට) | 350 000 | |
| ලීබඩු (පිරිවැයට) | 80 000 | |
| ලීබඩු සඳහා ක්ෂය වෙන්කිරීම් - 2010.01.01 දිනට | | 16 000 |
| ණයගැතියෝ | 45 000 | |
| ණයහිමියෝ | | 62 000 |
| 15% බැංකු ණය | | 100 000 |
| වරිපනම් හා රක්ෂණ ගාස්තු | 9 000 | |
| බැංකු ණය පොලී | 10 000 | |
| වේතන | 24 000 | |
| දුන් වට්ටම් | 6 000 | |
| ලැබූ වට්ටම් | | 8 000 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 7 500 | |
| දුරකථන ගාස්තු | 5 600 | |
| ගැනිලි | 20 000 | |
| අතැති මුදල් | 62 000 | |
| | 627 500 | 627 500 |

අමතර තොරතුරු :

(i) 2010.12.31 දිනට ඉදිරියට ගෙවූ වරිපනම් හා රක්ෂණ ගාස්තු රු. 1 500 කි.

(ii) ණයගැතියන්ගෙන් රු. 2 500 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතු ය.

(iii) ලීබඩු 10% බැගින් සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කළ යුතු ය.

**අවශ්‍යවන්නේ :**

(1) 2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම *(ලකුණු 05 යි.)*

(2) 2010.12.31 දිනට ශේෂ පත්‍රය *(ලකුණු 05 යි.)*

*(මුළු ලකුණු 10 යි.)*

## අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

7. (1)

**රවිඳුගේ ව්‍යාපාරය**
**2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** (1/2)
**ලාභාලාභ ගිණුම**

| | | (රු.) | | | (රු.) |
|---|---|---|---|---|---|
| <u>ආයතන හා පරිපාලන වියදම්</u> | | | දළ ලාභය ඉ/ගෙ | | 191,500 (1/2) |
| | | | <u>මෙහෙයුම් ආදායම්</u> | | |
| වරිපනම් හා රක්ෂණ | 7,500 (1/2) | | ලද වට්ටම් | | 8,000 |
| ලී බඩු ක්ෂය | 8,000 (1/2) | | | | |
| වේතන | 24,000 | | | | |
| ලිපි ද්‍රව්‍ය | 7,500 | | | | |
| දුරකථන ගාස්තු | 5,600 | 52,600 (1/2) | | | |
| <u>විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්</u> | | | | | |
| බොල්ණය | 2,500 (1/2) | | | | |
| දුන් වට්ටම් | 6,000 | 8,500 (1/2) | | | |
| <u>මූල්‍ය හා වෙනත් වියදම්</u> | | | | | |
| බැංකු ණය පොලී | 15,000 (1/2) | 15,000 | | | |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා (1/2) | | 123,400 (1/2) | | | |
| | | 199,500 | | | 199,500 |

(2)

**රවිඳුගේ ව්‍යාපාරය**
**2010.12.31 දිනට ශේෂපත්‍රය** (1/2)

| | (රු.) | (රු.) | | පිරිවැය (රු.) | සමුච්චිත ක්ෂය (රු.) | ශුද්ධ අගය (රු.) (1/2) |
|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය | | | **ජංගම නොවන වත්කම්** | | | |
| 2010.01.01 ශේෂය | 250,000 | | ඉඩම් හා ගොඩනැගිලි | 35,000 | (1/2) - | 350,000 |
| එකතු : ශුද්ධ ලාභය (1/2) | 123,400 | | ලීබඩු | 80,000 | 24,000 | 56,000 |
| | 373,400 | | (1/2) | 430,000 | 24,000 | 406,000 |
| අඩු : ගැනිලි | (20,000) (1/2) | 353,400 | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | **ජංගම වත්කම්** | | | |
| | | | ඉතිරි බඩු තොගය | | 8,400 | |
| 15% බැංකු ණය | | 100,000 | ණයගැතියෝ | | 42,500 (1/2) | |
| | | | ඉදිරියට ගෙවූ රක්ෂණය | | 1,500 (1/2) | |
| **ජංගම වගකීම්** | | | අතැති මුදල් | | 62,000 | 114,400 (1/2) |
| ණයහිමියෝ | 62,000 | | | | | |
| ගෙවිය යුතු බැංකු ණය පොලී | (1/2) 5,000 | 67,000 (1/2) | | | | |
| | | 520,400 | | | | 520,400 |

**(ලකුණු 05 යි)**

| 07. | (1) | (2) | |
|---|---|---|---|
| | 05 | 05 | $= \frac{10}{10}$ |

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




7 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ 62%ක පිරිසකි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 15%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වඩා ලබාගත් පිරිස 26%ක් වන අතර 36%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට වඩා අඩුවෙනි.




මෙම ප්‍රශ්නයෙහි කොටස් 2ක් ඇති අතර 1 කොටසෙහි පහසුතාව 53%ක් වන අතර 2 කොටසෙහි පහසුතාව 59%ක් වේ.

මෙම ප්‍රශ්නය ව්‍යාපාර මෙහෙයුම් ප්‍රතිඵල ගණනය කිරීම යන නිපුණතා මට්ටම ඇසුරින් සකස් කර තිබුණි. මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණේ අපේක්ෂකයින්ගෙන් 62%කි. 1 කොටසෙහි පහසුතාව 53% වන අතර 2 කොටසෙහි පහසුතාව 59%ක් වේ.

පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී සිසුන් අභ්‍යාසවල වැඩි වශයෙන් නිරතවීමක් තිබූ බව මෙම ප්‍රශ්නය වැඩි පිරිසක් තෝරා ගැනීමෙන් හා සාර්ථක පිළිතුරු සැපයීමෙන් පෙනී යයි.

1 කොටසෙහි සපයන ලද පිළිතුරුවල සමහර ලකුණු හිමි කර ගැනීමට නොහැකි වූයේ බොහෝ විට ලාභලාභ ගිණුමේ මාතෘකා නිසි පරිදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමයි. ලාභාලාභ ගිණුමේ වියදම් ශීර්ෂවලට වෙන්කිරීමේ නිපුණතාවට සාර්ථකව ළඟා නොවීම නිසා වියදම් ශීර්ෂවල එකතුවට හිමි ලකුණු අහිමි වී තිබුණි.

2 කොටසේ ශේෂපත්‍රයට අදාළව ලකුණු අඩුවීමට හේතුවක් වූයේ ජංගම වගකීම් ලෙස උපචිත බැංකු ණය පොලී නිවැරදි ලෙස ගැළපීම් නොකිරීමයි.

පන්තිකාමරය තුළ සිසුන් තවදුරටත් විවිධ අයිතම ඇතුළත් අභ්‍යාසවල නිරත කරවීම, විධිමත් ආකෘතියක් යටතේ අවසාන ගිණුම් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව තහවුරු කිරීම හා ප්‍රතිපෝෂණය ලබා දීම තුළින් මෙම නිපුණතා මට්ටම් වර්ධනය කළ හැකි වේ.

සමස්තයක් ලෙස II ප්‍රශ්න පත්‍රයේ ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවල පහසුතාව ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රයේ ප්‍රශ්නවලට වඩා වැඩි වී ඇත. ගිණුම්කරණ විෂය ක්ෂේත්‍රයේ නිපුණතා විෂය නිර්දේශයේ අගභාගයේ පැවතීම හේතුවෙන් එම කොටස් ආවරණය නොවීම මෙයට හේතුවක් විය හැකිය. එසේම ගිණුම්කරණයට අදාළ අභ්‍යාසවල සිසුන් නිරත කරවීම ප්‍රමාණවත් නොවීම ද මෙයට හේතුවක් වේ. පාඩම් නිසි ලෙස සැලසුම් කර ගැනීමෙන් මෙම තත්ත්ව වළක්වා ගත හැකිය.

### 2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II පත්‍රය ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණ විෂය ක්ෂේත්‍ර සඳහා වූ ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයා ඇති ආකාරය**




ප්‍රස්තාරයට අනුව ව්‍යාපාර අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයේ පහසුතාව ගිණුම්කරණ ක්ෂේත්‍රයට වඩා 11%කින් වැඩි වී ඇත.

# III කොටස

## 3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

### 3.1. පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයින් සැලකිලිමත් විය යුතු කරුණු :-

**පොදු උපදෙස් :**

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව, අනිවාර්ය ප්‍රශ්න සංඛ්‍යාව, ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය, එක් එක් ප්‍රශ්නයට හිමි ලකුණු ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. තවද ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.
- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.
- ★ I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් තෝරා ගත යුතුය. තවද පිළිතුරු පත්‍රයේ පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.
- ★ II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.
- ★ ප්‍රශ්න අංක හා අනුකොටස්වල අංක හෝ අක්ෂර නිවැරදිව ලිවිය යුතුය.
- ★ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකළ යුතු අතර විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.
- ★ ප්‍රශ්නයේ සඳහන් කර ඇති ආකාරයට අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.
- ★ පිළිතුරු ලිවීම සඳහා නිල් හෝ කළු පෑනක් භාවිත කළ යුතු අතර පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකළ යුතුය.
- ★ විභාග කාලය තුළදී විභාග ශාලාධිපතිගේ උපදෙස්වලට අනුව විනය ගරුකව කටයුතු කළ යුතුය.

**විශේෂ උපදෙස් :**

- ★ ප්‍රශ්න තෝරා ගැනීමේ දී අනිවාර්ය ප්‍රශ්නය ගැන සැලකිලිමත් විය යුතු අතර ඒ ඒ විෂය ක්ෂේත්‍රවලින් තෝරාගත යුතු ප්‍රශ්න නියමිත පරිදි තෝරා ගත යුතුය.
- ★ ප්‍රශ්න පත්‍රයේ සඳහන් නියමිත ප්‍රශ්න ගණනට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර අමතර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් වැළකී සිටිය යුතුය.
- ★ පිළිතුරු සැපයීමට ලබා දී ඇති කාලය අනුව එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ගත යුතු කාලය හා එයට හිමි ලකුණු පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
- ★ ප්‍රශ්නයට අදාළ පිළිතුරු පමණක් ලිවීම කළ යුතු අතර අනවශ්‍ය තොරතුරු ලිවීමෙන් වැළකී සිටිය යුතුය.
- ★ එක් ප්‍රශ්නයකට අදාළ කොටස් හා අනුකොටස්වල පිළිතුරු එකට සිටින සේ අමුණා තැබිය යුතුය.

3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :-

- ★ ගුරුවරයා විෂය නිර්දේශයට අදාළ විෂය කරුණු පිළිබඳ ව දැනුවත් වීම හා යාවත්කාලීන වීම
- ★ සිසු නිපුණතා ගොඩනැඟීමට හැකිවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ආශ්‍රිත ක්‍රියාවලිය සැලසුම් කිරීම
- ★ හැකි සෑම අවස්ථාවකම ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කිරීමට උත්සාහ කිරීම
- ★ නිපුණතා පාදක විෂය මාලාව තුළ සෑම සිසුවකුම අඩු තරමින් ආසන්න ප්‍රවීණතාව කරා ළඟා කරවීමට ගුරුවරයාගේ අවධානය යොමු කිරීම
- ★ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී දැනුම ලබා දීමට පමණක් සීමා නොවී සිසු චින්තනය අවදි කිරීමටත් සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කිරීමටත් කටයුතු කිරීම
- ★ දන්නා දෙයින් නොදන්නා දෙයටත්, සරල දෙයින් සංකීර්ණ දෙයටත්, සංයුක්ත දෙයින් වියුක්ත දෙයටත් සිසුන් ගෙනයාම සඳහා ගුරුවරයා කටයුතු කිරීම
- ★ සිත් ගන්නා සුළු ආරම්භයක් සහිතව ක්‍රියාකාරකම්වලට ප්‍රවේශ වීම හා අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම
- ★ පන්තිකාමරයෙන් බැහැරව ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කර දීම
- ★ කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් ස්වයං විනය, අන්‍යයන්ට සවන් දීම, අන්‍ය මත ඉවසීම, අන්‍යයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම, ඔවුනොවුන්ට උපකාර කිරීම, අවංක බව ආදී සාමාන්‍ය ජීවිතයට අවශ්‍ය වන වැදගත් කුසලතා සංවර්ධනය කර ගැනීමට සිසුන්ට ඉඩකඩ සලසා දීම
- ★ නියමිත කාලසීමාවන් තුළ විෂය නිපුණතා මට්ටම් නිම කිරීම, අතිරේක අභ්‍යාසවල යෙදවීම සහ ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණය සිසුන්ට ලබා දීම
- ★ අවශ්‍ය අවස්ථාවලදී ක්ෂේත්‍ර චාරිකා, අන්තර්ජාල පරිශීලනය, අතිරේක පොත්පත් කියවීම යනාදිය තුළින් සිසුන්ගේ විෂය දැනුම පෝෂණය කිරීම